2024

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT



ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

இலங்கை மதுவரித் திணைக்களம்

EXCISE DEPARTMENT OF SRI LANKA

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT

2024

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් , ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද

PFD / RED / COPA / 2019 / 01 අංක දරණ **2020.01.30** දිනැති මාර්ගෝපදේශ අනුව සකස් කරන ලදී

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම	-	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
ආයතනයේ ලිපිනය	-	අංක 353 , කෝට්ටේ පාර , රාජගිරිය
වැය ශීර්ෂ අංකය	-	248 - සුරාබදු දෙපාර්තමේන්තුව
Email	-	excisen@slt.lk
Web	-	*www*.excise.gov.lk
Telephone No	-	0113-888022
Fax	-	0112-877890
පැය 24 ඇමතුම්	-	1913

පටුන

පිටු අංක

පරිච්ඡේදය - 01 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම 3
1.2 සුරාබදු දෙපාර්තමේන්තුවේ දැක්ම , මෙහෙවර පරමාර්ථ, ප්‍රධාන කාර්යයන් හා අඟයයන් 4
1.3 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 7
1.4 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටීමේ සිතියම 8

පරිච්ඡේදය - 02 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය 11
2.2 ඉදිරි ඉලක්ක සහ අභියෝග 16
2.3 සුභසාධනය 18

පරිච්ඡේදය - 03 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 23
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 24
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 25
3.4 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය- සුරාබදු තෑගි අරමුදල 26
3.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල 27
3.6 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල 28
3.7 මූල්‍ය ප්‍රකාශ සටහන් 29
3.8 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 29
3.9 මු.රෙ.208 ප්‍රකාරව, දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ලෙස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 2024 වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 29
3.10 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 29
3.11 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ඇමුණුම 1 30
3.12 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව - සුරාබදු තෑගි අරමුදල ඇමුණුම 2 30

පරිච්ඡේදය - 04 කාර්යසාධන දර්ශක

4.1 හැඳින්වීම 33
4.2 ආයතනයේ කාර්යසාධන දර්ශක 34

පරිච්ඡේදය - 05 තිරසාර සංවර්ධන අරමුණු (SDG) හඳුනා ගැනීමේ කාර්යසාධනය

5.1 හැඳින්වීම 37
5.2 තිරසාර සංවර්ධනය ඉලක්ක මත පදනම් වූ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් හා ප්‍රගතිය 38

පරිච්ඡේදය - 06 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක කළමනාකරණය 45
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය 45
6.3 පුරප්පාඩු පිළිබඳ තොරතුරු 47
6.4 මානව සම්පත් සංවර්ධනය 49

පරිච්ඡේදය - 07 අනුකූලතා වාර්තාව

7.1 ආයතනයේ කාර්යසාධනය උදෙසා දායකවන ආකාරය පිළිබඳ අනුකූලතා වාර්තාව 55

පරිච්ඡේදය - 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, පරමාර්ථ, ප්‍රධාන කාර්යයන් හා අඟයයන්

1.3 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය

1.4 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටීමේ සිතියම

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වසර එකසිය දොළහක ඉතිහාසයක් ඇති රාජ්‍ය ආදායම් එකතු කරන ප්‍රමුඛතම ආයතනයකි. සුරාබදු සහ දුම්කොළ බදු ආදායම් කළමනාකරණය, ඊට අදාළ නීති ක්‍රියාත්මක කිරීම හා සමාජ ආරක්ෂණය යන තෙවැදෑරුම් මෙහෙවරයන් ඉටු කිරීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. වර්ෂ 1912 සිට වසර එකසිය දොළහක කාලය තුළ විශේෂ සිදුවීම් රැසක් වාර්තා වූ අතර, සමාලෝචිත 2024 වර්ෂයේ ද ආදායම් රැස්කර රාජ්‍ය ආදායමට දායකත්වය දැක්වීමට වඩාත් කැපවීමෙන් කටයුතු කල වසරකි.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල් ධුරයට කැබිනට් අමාත්‍ය මණ්ඩල තීරණය මත මා 2024.12.12 දින පත් කරන ලදී. සමාලෝචිත 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ පරිපාලන හා අධීක්ෂණ කටයුතු සඳහා අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්වරයෙකු, ප්‍රධාන මූල්‍ය නිලධාරිනියක්, සුරාබදු කොමසාරිස්වරයෙකු හා වැඩබලන සුරාබදු කොමසාරිස්වරයෙකු, ප්‍රධාන ගණකාධිකාරිවරයෙක්, හා වැඩබලන ගණකාධිකාරීවරයෙක්, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයෙකු, වැඩබලන නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන් පස්දෙනෙකු, ප්‍රධාන අභ්‍යන්තර විගණක නිලධාරියෙකු, නීති නිලධාරිනියක්, සහකාර අධ්‍යක්ෂිකාවක් (තොරතුරු තාක්ෂණ) සහ පරිපාලන නිලධාරීන් දෙදෙනෙකු සේවය කරන ලදී.

මීට අමතරව විගණකාධිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරන විගණන අංශයක්ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නියෝජනය කරන සංඛ්‍යාලේඛන අංශයක්ද පවතී.

සියලුම පළාත් ආවරණය වන සේ පිහිටි සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල 13 ක්, සුරාබදු අධිකාරි කාර්යාල 31 ක්, සුරාබදු ස්ථාන 56 ක්, මත්පැන් නිෂ්පාදනාගාර 28 ක්, ස්කාගාර 14 ක් සුරාබදු විශේෂ මෙහෙයුම් ඒකක 05 ක් හා මත්ද්‍රව්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් සහිතව දෙපාර්තමේන්තුව දීප ව්‍යාප්ත සේවාවක් සපයයි. මීට අමතරව මද්‍යසාර හා දුම්වැටි නිෂ්පාදනාගාර ආශ්‍රිතව පිහිටි සුරාබදු ඒකක වලට ද ස්ථීර කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර ඇත.

2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් ආදායම් ඉලක්කය රුපියල් බිලියන 232 කි. මත්පැන් බදු ආදායම රුපියල් බිලියන 230 ක් ලෙස ද දුම්කොළ බදු ආදායම් රුපියල් බිලියන 2ක් ලෙසද මෙම මුළු ආදායම රැස් කිරීමට ඉලක්ක ලබා දී තිබුණි. 2024 වර්ෂයේදී මත්පැන් බදු ආදායම ලෙස රුපියල් බිලියන 225.5 ක්ද දුම්කොළ බදු ආදායම් ලෙස රුපියල් බිලියන 1.2 ක් ද ලෙස රැස් කල අතර බදු අවකරණය (රුපියල් බිලියන 12.2) සහිතව සමස්ත සුරාබදු ආදායම රුපියල් බිලියන 226.7 ක් රැස්කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. 2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ විධායක ශ්‍රේණියේ හා අනෙකුත් නිලධාරී තනතුරු පුරප්පාඩුව පැවතීම 2024 වර්ෂයේ සමස්ත කාර්යසාධනය කෙරෙහි විශාල බලපෑමක් එල්ල කළ ද රැස් කරන ලද ආදායම 98% ක ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකිවීම සතුටට කරුණකි.

2024 වසරේදී සුරාබදු නිලධාරීන් විසින් දිවයින පුරා සිදු කරන ලද නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය වැටලීම් 37,555ක් මත නඩු පවරන ලද අතර, එමඟින් උපයා ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය රුපියල් 168,785,898.00 වේ. සුරාබදු බලපත්‍රලත් ස්ථානවල සිදුකළ බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කිරීම් 5,182 ක් වාර්තා වූ අතර, ඉන් අයකර ගත් සමථ මුදල් ප්‍රමාණය රුපියල් 159,642,538.00 කි.

දුම්කොළ බදු පනත උල්ලංඝනය කරමින් නීතිවිරෝධී ලෙස රටතුළට ගෙන එන ලද තෙන්දුකොළ ග්‍රහණ 69ක් 2024 වර්ෂයේදී වාර්තා වූ අතර එමඟින් තෙන්දුකොළ කිලෝග්‍රෑම් 43,975 ක් අත්අඩංගුවට ගන්නා ලදී. ඒ අනුව රුපියල් මිලියන 18.2 ක සමථ මුදලක් හා එම තෙන්දු කොළ වෙන්දේසි කිරීමෙන් රුපියල් මිලියන 95 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කරන ලදී.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1,649 ක් වන අතර,තත්‍ය සේවක සංඛ්‍යාව 1,142කි. පුරප්පාඩුව පැවති සේවක සංඛ්‍යාව 507 ක් වූ අතර, එය අනුමත සේවක සංඛ්‍යා වෙන් 31 % කි. අනුමත දෙපාර්තමේන්තුගත විධායක ශ්‍රේණියේ නිලධාරීන් සංඛ්‍යාව 56 ක් වුවත් එයින් 21 ක් පමණක් 2024 වර්ෂය තුළ රාජකාරී ඉටු කරන ලදී. ඒ අනුව 2024 වර්ෂය තුල විධායක නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස 63% කි. අනුමත විධායක නිලධාරී සංඛ්‍යාවෙන් අඩකටත් වඩා අඩු නිලධාරී සංඛ්‍යාවක භිඟයක් තුළ වුවද අපේක්ෂිත කාර්යසාධනය 98% ක් දක්වා සාක්ෂාත් කර ගැනීම විශේෂ ජයග්‍රහණයකි.

2024 වර්ෂය තුළ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 08 ක් සඳහා ජ්‍යෙෂ්ඨත්වය අනුව සුරාබදු අධිකාරීවරුන් 06 දෙනෙකු සඳහා කාර්යයන් පැවරීම සිදු කර ඇත. සුරාබදු අධිකාරීවරුන් 11 දෙනෙකු සහකාර සුරාබදු කොමසාරිස් තනතුරෙහි රාජකාරී ඉටුකිරීම/ආවරණය/වැඩබැලීම කිරීම සිදු කරන ලදී. සුරාබදු අධිකාරී තනතුරු 31 සඳහා ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරුන් විසින් රාජකාරී ආවරණය කරන ලදී. සුරාබදු අධිකාරී තනතුරු 08ක් සහ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 13 ක් සඳහා නිලධාරීන් උසස්කිරීමට අයදුම්පත් කැඳවා ඇත.

මෙම සමස්ත රාජකාරී ඉටු කිරීමේදී මුදල් අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරයට අදාළ සියලුම නිලධාරීන්, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සංචාරක ප්‍රවර්ධන අධිකාරිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සහ නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් සහාය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ ආයතනික කාර්යසාධන මට්ටම ඉහළ ප්‍රතිශතයකින් සපුරා ගැනීම සඳහා දෙන ලද සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සියලු සුරාබදු නිලයන්ගෙන්, ඒකාබද්ධ සහ දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන්ගෙන් සමන්විත සමස්ත සුරාබදු කාර්ය මණ්ඩලය වෙත මාගේ කෘතඥතාවය මෙයින් පුදකරමි.

යූ, එල්. උදය කුමාර පෙරේරා
සුරාබදු කොමසාරිස් ජනරාල්

යූ.එල්. උදය කුමාර පෙරේරා
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

1.2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ දැක්ම , මෙහෙවර, පරමාර්ථ, ප්‍රධාන කාර්යයන් හා අඟයයන්

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
Excise Department of Sri Lanka

"වගකීමෙන් සුරක්ෂාවට"
"Protection through responsibility"

දැක්ම

මත්පැන් හා දුම්කොළ කර්මාන්තය විධිමත්ව නියාමනය කිරීම තුළින් රාජ්‍ය ආදායම වර්ධනය කිරීම සඳහා කැප වූ වඩාත්ම ගෞරවනීය හා වගකිව යුතු රාජ්‍ය ආයතනය වීම.

මෙහෙවර

නීත්‍යානුකූල වෙළඳ ආදායම් උත්පාදනය සඳහා පහසුකම් සැලසීම තුළින් ද , ක්‍රියාත්මක කල හැකි සියලුම නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම බලාත්මක කිරීම තුලින්ද , නීති විරෝධී මත්පැන්, අන්තරායකර ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය අනිසි භාවිතයට එරෙහිව තියුණු දැනුවත් කිරීමේ වැඩසටහන් ඇති කිරීම තුළින් ද ප්‍රමිතියකට අනුකූල නොවූ මද්‍යසාර භාවිතය මගින් සිදුවන සෞඛ්‍ය උපද්‍රවයන්ගෙන් ආරක්ෂාව සහතික කිරීම තුළින් ද ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට සහය වීම සඳහා රට තුළ මත්පැන් සහ අනෙකුත් අනුමත මද්‍යසාර කාර්යක්ෂමව හා සඵලදායී ලෙස පරිපාලනය කිරීම.

පරමාර්ථ

- උපායමාර්ගික, මෙහෙයුම් සහ උපායික මට්ටම්වලදි ඵලදායි තීරණ ගැනීමට සහාය වීම සඳහා ආයතනික දර්ශනයක් ලෙස අනුකූලතාවය වැඩි දියුණු කිරීම සහ අවදානම් කළමනාකරණය කිරීම තුළින් ආදායම් එකතු කිරීම උපරිම කිරීම.

- ආදායම උපරිම කර ගැනීම අරමුණු කරගත් දැනුම අඛණ්ඩව හුවමාරුකර ගැනීම මගින් අදාළ නීතිවලට පාර්ශවකරුවන්ගේ අනුකූලතාවය ඉහළ නැංවීම තුළින් වෙළඳාම සඳහා පහසුකම් සැපයීම.

- මත්පැන් සහ දුම්කොළ ආදායම පාලනය කිරීම සහ පහසුකම් සැපයීම අතර ඇති සමතුලිතතාවය ළඟා කර ගැනීම සඳහා මූලික වන අවදානම් කළමනාකරණ මූලධර්ම ඵලදායී ලෙස යෙදීම.

- සුරාබදු එකතු කිරීමේදී අවංකභාවය සහ කාර්යක්ෂමතාවය කෙරෙහි මහජන විශ්වාසය පවත්වා ගෙනයාම.

- මත්පැන් නිෂ්පාදනය හා විකිණීම, පරිපාක ස්ත්‍රීතු, ස්වභාවය වෙනස් කල ස්ත්‍රීතු සහ වෙනත් අනුමත මත්ද්‍රව්‍ය නියාමනය කිරීම.

- නීතිවිරෝධී මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහිව තිරසාර මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ දැනුවත් කිරීම් සිදු කිරීම.

- නීති විරෝධී ස්ත්‍රීතු ආසවනය හා බලපත්‍ර රහිතව රහසිගතව සිදු කරන ස්ත්‍රීතු ආසවනය වැළැක්වීමට නීති, රීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

- මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීම වැළැක්වීම.

- විෂ මත්ද්‍රව්‍ය හා විෂ මත්පැන් වෙළඳාම පිටු දැකීමට කටයුතු කිරීම හා ඒවා භාවිතයෙන් මහජනයා ආරක්ෂා කර ගැනීම.

- අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය තුළින් ප්‍රමාණවත් වෘත්තීය හා තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සිටින බව සහතික කිරීම සඳහා සේවකයින්ගේ හැකියාවන් සහ ධාරිතාවය වර්ධනය කිරීම.

- උපරිම තෘප්තිමත්භාවයකින් හා මනා පුහුණුවකින් යුතුව සේවයට කැපවුණ කාර්යය මණ්ඩලයක් පවත්වා ගෙන යාම.

- මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් බාහිර ආයතන සමඟ මනා සම්බන්ධතාවයකින් සහ කාර්යක්ෂම බදු ක්‍රමයක් පවත්වා ගෙන යාම.

කාර්යයන් හා අගයයන්


කාර්යයන්

- සුරාබදු බලපත්‍රලාභී සියලුම පරිශ්‍රයන් අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ඉන් ලැබෙන ආදායම් එකතු කිරීම.
- සුරාබදු ආඥාපනත , දුම්කොළ බදු පනත කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.
- වස විෂ, අබිං හා අන්තරාදායක ඖෂධ ආඥාපනත සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.
- ජාතියේ සමාජ ආරක්ෂාව සඳහා ජාතික දුම්කොළ සහ මද්‍යසාර අධිකාරිය පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ පොලිස්, රේගු හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැනි වෙනත් නීති ක්‍රියාත්මක කරන ආයතන සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම.
- නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට එරෙහිව ආයතනික වැඩසටහන් හරහා දැනුවත් කිරීම හා නීති විරෝධී මත්පැන් හා අන්තරායකර ඖෂධවල හානිය පිළිබඳ සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීම.
- 2008 අංක 01 දරණ මත්ද්‍රව්‍ය හා මනෝවර්තක මත්ද්‍රව්‍යවල නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීම.
- සැලසුම් කල වර්ෂය තුළ සියලුම මට්ටමේ සේවකයන් සඳහා පුහුණුව ලබා දීම.
- රැස්වීම්, සාකච්ඡා සඳහා සියලුම පාර්ශවකරුවන් සමඟ ක්‍රියාකාරී සහභාගිත්වය.


අගයයන්

- සැමට එකලෙස සලකන මිත්‍රශීලි හා විනිවිද භාවයෙන් යුතු සේවා ලබා දීමේ සංස්කෘතියක් පවත්වා ගෙන යාම.
- අවසන් ඉලක්කය දක්වා ගමන් කල හැකි කණ්ඩායම් හැඟීමෙන් යුතු කැපවුණු කාර්යය මණ්ඩලයක් සිටීම.
- සුරක්ෂිත අනාගතයක් සඳහා දරු පරපුරට නිසි මග පෙන්වීම අරමුණු කරගත් නීති විරෝධී මද්‍යසාර, මත්ද්‍රව්‍ය තුරන් කිරීමට කටයුතු කිරීම.
- මනුෂ්‍ය වටිනාකම් අගය කරනු ලබන පුද්ගලයෙකු සමාජ ගත කිරීම.
- විධිමත් උපාය මාර්ගික සැලස්මක් තුළ කටයුතු කිරීම.
- නව තාක්ෂණ ක්‍රමවේද තුළින් සේවාලාභීන්ට කාර්යක්ෂම හා උපරිම සේවාවක් ලබා දීම.
- නවීන තාක්ෂණය මගින් නිවැරදි බදු එකතු කිරීම.
- මනා විශ්වාසයකින් යුත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- විෂ මත්ද්‍රව්‍ය හා විෂ මත්පැන් භාවිතය අවම කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- බාහිර ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම.

1.3 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.4 සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටීමේ සිතියම



පරිච්ඡේදය - 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

2.1.1 ආදායම්

2.1.2 පාලන

2.1.3 තොරතුරු තාක්ෂණ

2.1.4 නීති ක්‍රියාත්මක කිරීම්

2.1.5 යෙදවුම්

2.1.6 අධ්‍යයන හා පර්යේෂණ

2.1.7 සැපයුම් දාම නියාමන

2.1.8 නීති

2.1.9 සමාජ ආරක්ෂණ

2.1.10 අභ්‍යන්තර විගණන

2.1.11 සංඛ්‍යාලේඛන

2.2 ඉදිරි ඉලක්ක සහ අභියෝග

2.2.1 ඉදිරි ඉලක්ක

2.2.2 අභියෝග

2.3 සුභසාධනය


2.3.1 කාර්යාලීය සුභසාධනය

2.3.2 ක්‍රීඩා

2.1 ප්‍රගතිය

2 : 1 : 1 ආදායම්

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 2024 වසර ආරම්භයේදී මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව සුරාබදු හා දුම්කොළ බදු ආදායම රුපියල් බිලියන 232ක් එකතු කිරීම සඳහා එකඟ වූ අතර මත්පැන් සඳහා ආදායම් බද්ද රුපියල් බිලියන 230 ක් ද දුම්කොළ බදු සඳහා ආදායම් බද්ද රුපියල් බිලියන 2 ක් ද ලෙස ආදායම් ඉලක්ක මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. ඒ අනුව මත්පැන් බදු ආදායම රුපියල් බිලියන 225.5 ක් ද දුම්කොළ බදු ආදායම රුපියල් බිලියන 1.2 ක් ද රැස් කරන ලද අතර 2024 වර්ෂයේදී සමස්ත ආදායම ලෙස රුපියල් බිලියන 226.7 ක් රැස් කරන ලදී. තවද අපනයනය කරන ලද මත්පැන් සඳහා ඇ.එ.ජ.ඩොලර් මිලියන 13.7 ක් සහ යුරෝ 299,772 ක් වශයෙන් විදේශ විනිමය ලෙස දිවයිනට ලැබී ඇත. 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ මත්පැන් බදු ආදායම 27% කින්ද, මත්පැන් නිෂ්පාදනය 1.4% කින් ද ඉහළ යාමක් පෙන්නුම් කරයි. තවද මත්පැන් සහ දුම්කොළ බදු ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය 98% කි. 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී දුම්කොළ බදු ආදායම 18% ක වර්ධනයක් පෙන්නුම් කරයි.



- එසේම මත්පැන් සහ මෘදු මත්පැන් අපනයනය කිරීම මත රුපියල් බිලියන 12.2 ක සුරාබදු අවකරණයෙන් පසුව රුපියල් බිලියන 214.58 ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත යැවීමට හැකි විය.

2: 1 : 2 පාලන

- 2024 වර්ෂය තුළ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 08 ක් සඳහා ජ්‍යෙෂ්ඨත්වය අනුව සුරාබදු අධිකාරීවරුන් 06 දෙනෙකු සඳහා කාර්යයන් පැවරීම සිදු කර ඇත. සුරාබදු අධිකාරීවරුන් 11 දෙනෙකු සහකාර සුරාබදු කොමසාරිස් තනතුරෙහි රාජකාරී ඉටුකිරීම/ ආවරණය කිරීම සිදු කරන ලදී.

- සුරාබදු අධිකාරී තනතුරු 08ක් සහ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 13 ක් සඳහා නිලධාරීන් උසස්කිරීමට සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි අධිසේවක පදනම මත 67 දෙනෙකු බඳවා ගැනීමට 2024.12.20 දින අයදුම්පත් කැඳවා ඇත. සුරාබදු පරීක්ෂක තනතුරු 22 ක් සඳහා සීමිත පදනම මත ද, සුරාබදු පරීක්ෂක තනතුරු 34 ක් සහ සුරාබදු නියාමක තනතුරු 100 ක් සඳහා විවෘත පදනම මත ද බඳවා ගැනීමට තරඟ විභාගය පවත්වා ඇති අතර එහි ප්‍රතිඵල නිකුත් කර ඇත.

- සුරාබදු නියාමක තනතුරු 11 ක් සඳහා සීමිත පදනමින් බඳවා ගැනීම සඳහා සීමිත තරඟ විභාගය 2024.05.25 දින හා සම්මුඛ පරීක්ෂණය 2024.07.24 දින පවත්වා ඇති අතර එහි ප්‍රතිඵල 2024.08.12 දින ප්‍රසිද්ධ කර ඇත.

- සුරාබදු නියාමක රියදුරු තනතුරු 15 ක් සඳහා බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය 2024.07.28 දින පවත්වා එම ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය පවත්වා අවසන් කරන ලද අතර ඉන් අයදුම්කරුවන් 12 ක් සුදුසුකම් ලබන ලදී. ඒ අනුව ඉදිරියේ ඔවුනට පත්වීම් ලබා දීමට නියමිතය.

- එසේම දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යය මණ්ඩලයේ වැටුප් වර්ධක 886 ක් ලබාදීමට කටයුතු කර ඇත. අග්‍රහාර රක්ෂණ ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්පත් 139 කට අදාලව ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කර ඇති අතර නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 33 දෙනෙකු සහ සිවිල් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකු විශ්‍රාම ගන්නා ලද අතර ඒ සම්බන්ධව කටයුතු සිදු කරන ලදී.


- තවද මෙම දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා වෙන් කිරීම් 176 ක් මෙම වර්ෂය තුළදී සිදු කර ඇත. එසේම නිල ඇඳුම් කාර්යය මණ්ඩලය සඳහා සහ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා රාජකාරී හැඳුනුම්පත් 60 ක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

- තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ දෙපාර්තමේන්තුව වෙත ලද තොරතුරු ඉල්ලීම් 68 ක් සඳහා අවශ්‍ය පිළිතුරු සැපයීමට කටයුතු සිදු කර ඇත.

2: 1 : 3 තොරතුරු තාක්ෂණ

- ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ASYCUDA පද්ධතිය හරහා සුරාබදු හා සම්බන්ධිත ආනයන හා අපනයන කටයුතු සඳහා අවැසි නිර්දේශ හා අනුමැතියන් මාර්ගගතව ලබාදීමට හා ඊට අදාල නිලධාරීන්ට පුහුණුව හා තොරතුරු තාක්ෂණ පහසුකම් සැපයීම.
- රජයේ ගිණුම් කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම යටතේ හා ක්‍රම සහ විධි කාරක සභාව යටතේ අධීක්ෂණය වන දෙපාර්තමේන්තුව සඳහා යෝජිත ආදායම් පරිපාලන පද්ධතියේ අවශ්‍යතා පිරිවිතර ලේඛනය (Schedule of Requirements -SOR) සකස් කරන ලදී. යෝජිත පද්ධතිය මගින් දත්ත හුවමාරු කල යුතු අනෙකුත් රාජ්‍ය ආයතන මෙන්ම හුවමාරු කිරීමට නියමිත දත්ත හඳුනාගැනීම සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා විශේෂඥ උපදේශක වරයෙකු පත්කරන ලදී. ඒ සඳහා මුදල් අමාත්‍යාංශ අනුමැතියද ලබා දී ඇත. 2025 ජනවාරි මස මෙම ව්‍යාපෘතියට අදාල ලංසු කැඳවීමට අපේක්ෂා කරනු ලැබේ.

2:1:4 නීති ක්‍රියාත්මක කිරීම (අපරාධ)



- 2024 වර්ෂය තුලදී දිවයින පුරා පිහිටි සුරාබදු බලපත්‍රලත් ස්ථාන පූර්ණ අධීක්ෂණය හා පරිපාලනය තුළින් ඒ හා සම්බන්ධ බලපත්‍ර කොන්දේසි කඩකිරීම සම්බන්ධ කාර්මික අපරාධ වාර්තා 5,182 ක් ඉදිරිපත් කිරීමෙන් රජයට සමථ මුදල් ලෙස රුපියල් 159,642,538.00 ක් ලබා දීමට හැකි වීම.

- 2024.05.20 සිට 2024.08.27 දක්වා කාලය තුල දින 100 ක විශේෂ ග්‍රහණ වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි. මෙම දින 100 විශේෂ ග්‍රහණ වැඩසටහන මගින් දෙපාර්තමේන්තුවේ ආදායම් ඉලක්ක වෙත සාර්ථකව ළඟා වීම, ගෘහස්ථ හා වාණිජ මට්ටමෙන් රට තුළ ව්‍යාප්ත වන නීති විරෝධී ස්ප්‍රිතු පෙරීම හා භාවිතය මර්ධනය කර අදාල ආදායම් ඉලක්කයට ළඟා වීම හා මහජනතාවට ප්‍රමිතියෙන් තොර මත්පැන් භාවිතය අවම කිරීමට කටයුතු කිරීම, රට පුරා ව්‍යාප්ත වන නීති විරෝධී මත් ද්‍රව්‍ය මර්ධනය තුළින් සමාජ ආරක්ෂාව තහවුරු කිරීමට දායක වීම මේ මඟින් අපේක්ෂිත බාහිර අරමුණු අතර විය.

- නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍ය වැටලීම් 37,555 ක් මත නඩු පවරා රුපියල් 168,785,898.00 ක දඩ මුදල් ප්‍රමාණයක් උපයා ගැනීමට හැකි වීම.

- මහජනතාව හා සමීපව සම්බන්ධ වීම සඳහා සහ මහජන පැමිණිලිවලට ප්‍රමුඛතාවයක් ලබා දීම සඳහා විශේෂ දුරකථන අංකය වන 1913 පැය 24 පුරා ක්‍රියාත්මක කිරීම තුළින් පැමිණිලි 934 ලැබුණු අතර, එම පැමිණිලි සුරාබදු පළාත් කාර්යාල වෙත ක්ෂණිකව යොමු කර ඇත.

- නීති ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා සහ නිලධාරීන්ගේ ආරක්ෂාව උදෙසා මිමි 9 පිස්තෝල 140 ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව, ආරක්ෂක අමාත්‍යාංශය සමග එක්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කල අතර 2023 වර්ෂයේදී මෙම ගිනි අවි 118 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මිලදී ගන්නා ලදී. එමෙන්ම 2024 වර්ෂයේදී මෙම ගිනි අවි 118 සඳහා අවශ්‍ය පතොරම් 4000 ක ප්‍රමාණයක් මිලදී ගැනීම සිදු කරන ලදී. මේ මගින් නීතිය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන්ට ආත්ම ආරක්ෂාව හා ක්ෂේත්‍රයේදී ඉහළ මට්ටමේ වැටලීම් සිදු කිරීමට අවකාශය ලැබෙනු ඇත.

2:1:5 යෙදවුම්

- සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අරමුණක් වන දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන සියලුම මත්පැන්, ආනයනික මත්පැන්, මධ්‍යසාර ආසවන මූල ද්‍රව්‍ය ආදියෙහි ප්‍රමිතීන් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට සහ ගුණාත්මක නිෂ්පාදන වෙළඳපොළ වෙත යොමු කිරීමට මධ්‍යම රසායනාගාරයක් පවත්වාගෙන යාම ප්‍රධාන අවශ්‍යතාවයක්ව පවතී. ඒ

අනුව, පූගොඩ සුරාබදු ස්ථානයට අනුබද්ධව දෙපාර්තමේන්තුවට අයත් නවීන ගොඩනැගිල්ලක මෙම මධ්‍යම රසායනාගාරය ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදන මුදලක් 2023 අයවැය මගින් අනුමත වී තිබූ අතර 2024 වර්ෂය අවසන් වන විට රසායනාගාරයේ කටයුතු අවසන් අදියරට පැමිණ ඇත.



යාපනය රසායනාගාරය



පූගොඩ රසායනාගාරය

- 2024.12.31 දින වන විට සුරාබදු දෙපාර්තමේන්තුව භුක්ති විඳින සින්නක්කර ඉඩම් ගණන 30 ක් වූ අතර ඉන් ඉඩම් 14 ක අයිතිය පවරා ගෙන ඇති අතර , ඉඩම් 13 ක අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.
- දැනට දෙපාර්තමේන්තුව සතු වාහන වලින් 70% ක් පමණ වසර 20 කට වඩා පැරණි වාහන අතර එම වාහන අලුත්වැඩියා කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් ප්‍රවාහන කටයුතු සඳහා වාහන යොදා ගැනීමේදී අපහසුතාවයන් මධ්‍යයේ කටයුතු කිරීමට සිදු විය.
- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 25 ක් කුලී පදනම මත සිය මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි.
- දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලා නඩත්තු කිරීමේ කටයුතු සිදු කර ඇත.

2:1:6 අධ්‍යයන හා පර්යේෂණ

- ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන මත්පැන් මෙන්ම විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සුරාබදු මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීම 2021 වර්ෂයේ ආරම්භ කර ඇත. ඒ අනුව 2024 වර්ෂය අවසානයේ දී අවශ්‍ය උපකරණ ලබා ගැනීම සහ යටිතල පහසුකම් සපුරා ගෙන ඇති අතර 2025 වර්ෂයේ දී කාර්ය මණ්ඩල බඳවාගෙන පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත. තවද සිදුව ස්කාගාර පරීශ්‍රයේ කුඩා පරිමාණයේ රසායනාගාරයක් දැනටමත් ක්‍රියාත්මක වන අතර යාපනය කෝපායී ප්‍රදේශයේ එවැනිම රසායනාගාරයක් ස්ථාපිත කිරීමට නියමිතය.

- ශ්‍රී ලංකාව තුළ මහ රා සඳහා නිශ්චිත ප්‍රමිතියක් නොතිබීම නිසා කෘතිම රා නිෂ්පාදනය කිරීම පාලනය කිරීමට බාධා මතුවිණ. ඒ අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අධ්‍යයන හා පර්යේෂණ අංශය, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය හා රජයේ රස පරීක්ෂක කාර්යාලය සමඟ ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනයේ ද සහභාගීත්වයෙන් පොල් රා සඳහා ප්‍රමිතියක් සකස් කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී. විශේෂඥ උපදෙස් පරිදි තෝරාගත් නියැදිවලින් රා නිදර්ශක ලබා ගෙන විශ්ලේෂණය කර අවසන් කර ඇත. ඒ අනුව රා සම්බන්ධයෙන් සකස් කරන ලද ප්‍රමිතීන් පිළිබඳව මහජන අදහස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වෙබ් අඩවියේ දැන්වීම් පළ කර ඇත. එහිදී ලැබෙන මහජන අදහස් සලකා බලා සකස් කර ඇති රා ප්‍රමිතීන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ප්‍රකාශයට පත් කරනු ඇත.

- මීට අමතරව දේශීයව නිපදවන විදේශ මත්පැන් මෙන්ම අරක්කු හා බියර් සඳහා ද මේ වන විට ප්‍රමිතීන් සකස් කර අවසන් කර ඇති අතර එම ප්‍රමිතීන් හා සුරාබදු ආඥා පණතේ නීතිමය ප්‍රතිපාදන පිළිබඳව පවතින යම් ගැටළු නිරාකරණය කර ගැනීමට විශේෂඥ කමිටුවක් පත් කර ඇත. එමෙන්ම පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව අවධාරණය කර ඇති පරිදි, පාරිභෝගිකයින්ගේ සෞඛ්‍ය ආරක්ෂිත බව රැකගැනීම උදෙසා ස්ප්‍රිතු මඟින් නිපදවන මත්පැන් සඳහා ප්‍රමිතීන් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත්කිරීම කාලීන අවශ්‍යතාවයකි. සකේ, සයිඩර් සහ වයින් සඳහා ද ප්‍රමිතීන් සකස් කිරීමට 2025 වර්ෂයේදී කටයුතු සම්පාදනය කරමින් පවතී.

- සැර මත්පැන් බියර්, සකේ සහ සයිඩර් බෝතල් ගත කරන නිෂ්පාදනාගාර 28 ක්, ස්කාගාර 13 ක් ද, ගුදම් 15 ක් ද මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතී. සුරාබදු ප්‍රාදේශිය කාර්යාල 56 ක් මඟින් ඉහත නිෂ්පාදනාගාර තුළ නිපදවන මත්පැන් වෙළඳපොලට නිකුත් කළ පසුව එහි ප්‍රමිතිය පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු වේ. 2024 වර්ෂයේදී රුපියල් මිලියන 29.7 ක මුදලක් වැය කර සැර බලන උපකරණ කට්ටල 125 ක් සුරාබදු ස්ථාන හා ඒකක වෙත බාර දී ඇත.

- තවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනාවක් මත, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අධ්‍යයන පර්යේෂණ) යටතේ අවධානම් කළමනාකරණ ඒකකයක් ද පිහිටුවා තෝරාගත් නිලධාරීන් කණ්ඩායමක්ද 2024 වර්ෂය තුළ පත් කර ඊට අදාළ විමර්ශනයන් ද මේ වන විට සිදු කරමින් පවති.

- මීට අමතරව ශ්‍රී ලංකාව තුළ සංසරණය වන නීති විරෝධී ස්ප්‍රිතු සම්බන්ධව පර්යේෂණයක් කිරීමට ද නියමිතය.
- වාර්ෂික කාර්යසාධන වාර්තාව සැකසීම සහ එය නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, වාර්ෂික සහ කාර්තුමය ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා වගකීම

2:1:7 සැපයුම් දාම නියාමන

- සුරාබදු නිවේදන 04/ 2019 අනුව ආනයනික විදේ මත්පැන් සඳහා ආරක්ෂිත ස්ටිකරය ඇලවීම 2019.07.15 දින ආරම්භ කරනු ලැබූ අතර දේශීයව නිෂ්පාදිත මත්පැන් බෝතල් මත ආරක්ෂිත ස්ටිකරය සහ ඩිජිටල් සළකුණ යෙදීම ආරම්භ කරන දිනය ලෙස 2022 වර්ෂයේ ජනවාරි 03 දින ප්‍රකාශයට පත් කරමින් 10/2021 සුරාබදු නිවේදනය ප්‍රකාශයට පත් කර ඇත. මේ වනවිට සුරාබදු නිවේදන 07/ 2021 රීති ප්‍රකාරව දේශීයව නිෂ්පාදිත මත්පැන් හා ආනයනික විදේශ මත්පැන් සඳහා ආරක්ෂිත ස්ටිකරය සහ ඩිජිටල් සළකුණ යෙදීම සිදු කරනු ලැබේ.
- සැපයුම් දාම නියාමන අංශය විසින් 2024 වර්ෂයේ මත්පැන් නිෂ්පාදනාගාර සඳහා නිකුත් කර ඇති Paper Base ස්ටිකරය (Local) සහ Digital කේතය (Local), Paper Base ස්ටිකරය (Foreign) අලෙවිය මඟින් රු.217,939,108.00 මුදලක් උපයාගෙන ඇත.
- ව්‍යාජ ආරක්ෂිත ස්ටිකර් ඇලවීම සම්බන්ධව 2024 වර්ෂයේ දී සිදුකරන ලද වැටලීම් වලදී එම මත්පැන් බෝතල් වලට අදාල බදු මුදල්, 3% ප්‍රමාද ගාස්තු හා කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කොට ඒ සඳහා උපරිම සමථ මුදල් හා අදාල බදු මුදල් අය කර ගෙන ඇත.

2:1:8 නීති

- සුරාබදු කොමසාරිස් ජනරාල්තුමාගේ සෘජු අධීක්ෂණය හා පාලනය යටතේ ඔහු විසින් පවරනු ලබන නීතිමය කටයුතු ඉටුකිරීම, ඊට අදාළ ලේඛණ කෙටුම්පත් කිරීම, විශේෂයෙන්ම නීතිපති දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව ඇතුළු වෙනත් බාහිර රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයක් පත්වාගෙන යාම මෙම ඒකකයේ ප්‍රමුඛ කාර්යයන් වේ.

- 2024 වර්ෂයේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති) මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක නීති අංශය නීති නිළධාරීන්, නිල ඇඳුම් හා නිල ඇඳුම් නොවන කාර්ය මණ්ඩලයකින් සමන්විතව සිය රාජකාරි ඉටු කරනු ලැබීය.

- විශේෂයෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුවට එරෙහිව ඉදිරිපත් කරනු ලබන මූලික අයිතිවාසිකම් හා රිට් පෙත්සම් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින් එකී පෙත්සම සඳහා සම්ප්‍රකාශ හා ලේඛණ සකස් කර ඉදිරිපත් කිරීම, පරිපාලන හා බලපත්‍ර සම්බන්ධයෙන් පැන නැගුණු නෛතික ගැටළු සඳහා උපදෙස් ලබාදීම , නිවේදන ඇතුළු නීතින් කෙටුම්පත් කිරීමට දායකවීම තුලින් සුරාබදු

දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා නෛතික බලගැන්වීම සිදු කිරීමට නීති අංශය උපරිම දායකත්වය සපයනු ලබයි.

2:1:9 සමාජ ආරක්ෂණ

ජනතාවගේ යහපැවැත්ම හා සෞඛ්‍ය ආරක්ෂිත බව සුරක්ෂිත කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් රාජ්‍ය ආයතන, පාසැල් වැනි ආයතනයන්හි සංවිධානය කිරීම සහ මත්පැන් කර්මාන්තය තුළදී සිදුවන පරිසර දූෂණය වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. 2024 වර්ෂයේදී මත්පැන් පරිභෝජනයෙන් පසු ඉවත දමන බෝතල් ආදිය තැන තැන දමා යාමෙන් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම සඳහා මත්පැන් අලෙවිසැල් අසල කූඩ සවි කරන ලද අතර මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 277 ක් දිවයින පුරා සිදු කර ඇත.



පාසැල් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම



රාජ්‍ය ආයතන සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම

2:1:10 අභ්‍යන්තර විගණන

- 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම (අභ්‍යන්තර විගණන සැලැස්ම) ප්‍රකාරව අපේක්ෂිත ඉලක්කය ඉක්මවා 110% ක ප්‍රගතියක් ලබා ඇත. මෙහිදී අපනයන මත නිෂ්පාදන ආදායමෙන් ආපසු ගෙවනු ලබන අවකරණ සම්බන්ධ විගණනයන් (රුපියල් 10,042,397,564.36) සහ සුරාබදු කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරනු ලබන විශේෂිත වූ විමර්ශන කටයුතු අවසන් කර අදාල වාර්තා සියල්ල ඉදිරිපත් කර ඇත.

2:1:11 සංඛ්‍යාලේඛන

- සුරාබදු දෙපාර්තමේන්තුව මගින් නියාමනය සිදු කරන මත්පැන් කර්මාන්තය පිළිබඳ සංඛ්‍යාලේඛන සැකසීම හා විශ්ලේෂණයන් සිදු කිරීම මෙම ඒකකයේ ප්‍රමුඛතම කාර්යයන් වේ.

- මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, පාර්ලිමේන්තුව ආදී රාජ්‍ය ආයතනයන් සඳහා යැවිය යුතු සංඛ්‍යාලේඛන සම්බන්ධ වාර්තාවන් සහ ඉදිරිපත් කිරීම් සැකසීම, රාජ්‍ය ආයතන සහ අන්තර්ජාතික ආයතන ඉල්ලුම් කරන දත්ත නිකුත් කිරීම ආදී කාර්යයන් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) මඟින් ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් ආයතනවල ආදායම වැඩි කිරීම සඳහා යෝජනා කරන ලද නිර්දේශ මත සුරාබදු දෙපාර්තමේන්තුවට අදාලව පහත සඳහන් කමිටු පිහිටුවන ලදී.

1. සුරාබදු ආදායම් කළමනාකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අවධානම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීම.

මෙම ඒකකය මඟින් මත්පැන් නිෂ්පාදනාගාර, ස්කාගාර, රා නිෂ්පාදනාගාර, මත්පැන් අලෙවිකරණ බලපත්‍රදාරීන්ගේ අලෙවිසැල් විශේෂ පරීක්ෂාවට ලක් කිරීම මඟින් ඒවායේ සිදුවන අක්‍රමිකතා සොයා බලා ඒ සඳහා නීති මඟින් කටයුතු කිරීම සිදු කරන ලදී.

2. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය බුද්ධි ඒකකයක් (FIU) පිහිටුවීම.

- ශ්‍රී ලංකා මහබැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සහ සුරාබදු දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුම 2024.01.09 දින අත්සන් තබන ලදී. එම අවබෝධතා ගිවිසුමට අනුව, අදාල කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කැපවන සහ හැකියාව ඇති වෘත්තිකයන්/විශේෂඥයන්ගෙන් සමන්විත ඒකකයක් පිහිටුවන ලදී.
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදී මූල්‍යකරණය මැඩපැවැත්වීම යටතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා 2024.07.19 දින ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී.
- මෙම ඒකකය මඟින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය මැඩපැවැත්වීම ආශ්‍රිත කරුණුවලට අදාල බුද්ධි තොරතුරු සහ එම තොරතුරුවලට අදාල පාර්ශ්වකරුවන් සමඟ හුවමාරු කර ගැනීමට අදහස් කරයි.
- සුරාබදු දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන වැටලීම් පිළිබඳ වර්ගීකරණය කරන ලද දත්ත සහ සුරාබදු ආදායම පිළිබඳ දත්ත ඵලදායී ලෙස පාර්ශවකරුවන් සමඟ බෙදා ගැනීම මෙම ඒකකය මඟින් සිදු කරයි.

3. අභ්‍යන්තර පාලන ඒකකයක් (IAU) පිහිටුවීම/ පැමිණිලි කළමනාකරණ විමර්ශන ඒකකය

නිලධාරීන් විවිධ අක්‍රමිකතාවයන් සම්බන්ධව පැමිණෙන පැමිණිලි විමර්ශනය කිරීම මෙම ඒකකය මඟින් සිදු කරයි. විවිධ වංචා , දූෂණ, අක්‍රමිකතා ආදිය පිළිබඳ විමර්ශනය කිරීමෙන් සුරාබදු ආදායම ඉහළ නංවා ගැනීමට මෙම ඒකකය මඟින් මනා පිටුවහලක් ලැබේ.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ අංක 23/340 දරණ වාර්තාවේ නිර්දේශ අනුව අභ්‍යන්තර පාලන ඒකකයක් 2024.07.26 දින පිහිටුවා ඇත.
- පසුව ජනාධිපති ලේකම්ගේ අංක PS/SB/CURCULAR දරණ 2/2025 චක්‍රලේඛය අනුව සෑම රජයේ ආයතනයක්ම මෙම අභ්‍යන්තර කටයුතු ඒකකය පිහිටුවීමට සමගාමීව වඩාත් ශක්තිමත්ව ස්ථාපනය කර ඇත.
- මේ දක්වා එම ඒකකයට විවිධ කරුණු සම්බන්ධයෙන් පැමිණිලි 11 ක් ලැබී ඇති අතර ඉන් 06 ක් අවසන් කර ඇත. ඉතිරි පැමිණිලි වාර්තා කැඳවා විමර්ශන මට්ටමේ පවතී.
- මීට අමතරව අභ්‍යන්තර පාලන ඒකකයේ මැදිහත්වීම අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා පැවති ආචාරධර්ම සංග්‍රහය නවීකරණය කර 2024.08.15 දින භාෂා ත්‍රිත්වයෙන් නිකුත් කල අතර එය දෙපාර්තමේන්තුවේ සියලුම දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් වෙත ලබාදී ඒ බැව් තහවුරු කරගෙන ඇත.

2:2 ඉදිරි ඉලක්ක සහ අභියෝග

2: 2: 1 ඉදිරි ඉලක්ක

ආදායම රුපියල් බිලියන 242 ක ඉලක්කයක් කරා ළඟාවීම

- 2024 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ලබා දුන් මත්පැන් හා දුම්කොළ සඳහා වූ බදු ආදායමෙහි ඉලක්කය රුපියල් බිලියන 232 ක් වූ අතර, ඉදිරි 2025 වර්ෂය සඳහා රුපියල් බිලියන 242 ක ආදායම් ඉලක්කයක් ලබා දී ඇත. 2025 වර්ෂය සඳහා ලබා දී ඇති ආදායම් ඉලක්කය වන රුපියල් බිලියන 242 , 2024 වර්ෂයේ සංශෝධිත ආදායම් ඉලක්කය සමඟ සසඳන විට 4.3% ක ඉහළ ආදායම් ඉලක්කයකි. 2025 වර්ෂයේ දී මත්පැන් සඳහා බදු ආදායම ලෙස රුපියල් බිලියන 240 ක් ද බීඩි නිෂ්පාදනය මත පනවන ලද නව බදු ප්‍රතිපත්තිය අනුව බීඩි සඳහා රුපියල් බිලියන 2 ක බදු ආදායමක් ද ලෙස ආදායම් ඉලක්ක ලබා දී ඇත.
- බීඩි කර්මාන්තයේ නියැලෙන සියලුම නිෂ්පාදකයන් නැවත ලියාපදිංචි කිරීම හා ඔවුන්ගේ වෙළඳ සළකුණු බුද්ධිමය දේපළ පනත යටතේ ලියාපදිංචි කිරීම තුළින් අයවිය යුතු බදු ආදායම නිසි පරිදි ලබා ගැනීම සඳහා දුම්කොළ බදු පනත සංශෝධනය සහ සුරාබදු නිවේදන නිකුත් කිරීම.
- අවධානම් කළමනාකරණ ඒකකය මඟින් සුරාබදු ආදායම වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගැනීම සහ එහිලා ඇතිවන අවධානම් අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

පාරිභෝගිකයන්ට ශරීරයට අහිතකර නොවන ආකාරයේ මත්පැන් ලබාදීමට පර්යේෂණයන් සිදු කර ප්‍රමිතියෙන් උසස් මත්පැන් ලබාදීම

පාරිභෝගිකයන්ට ශරීරයට අහිතකර නොවන ආකාරයේ මත්පැන් ලබාදීමට පර්යේෂණයන් සිදු කර ප්‍රමිතියෙන් උසස් මත්පැන් ලබාදීම

- මහ රා සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ප්‍රමිතීන් හඳුන්වා දුන් පසු එම ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීම තුළින් කෘත්‍රිම රා වෙළඳපොලට පැමිණීම වැලැක්වීම සහ ගුණාත්මක බවින් වැඩි රා වෙළඳපොලට පැමිණීම මඟින් රා සඳහා ඉල්ලුම වැඩි වීම.
- වයින් සහ සකේ සඳහා ප්‍රමිතීන් සකස් කිරීමට කටයුතු සිදු කිරීම.
- ස්ප්‍රිතු මඟින් නිපදවන මත්පැන් සඳහා සකස් කරන ලද ප්‍රමිතීන් ගැසට් පත්‍රයක් මඟින් ප්‍රසිද්ධ කිරීම.

නිසි උපායමාර්ග අනුගමනය කරමින් ආරක්ෂිත මුද්‍රා ස්ටිකර් යාවත්කාලීන කරමින් බදු නොගෙවන ලද මත්පැන් සංසරණය වීම වැළැක්වීමට පියවර ගැනීම.

- දේශීයව නිපදවන මත්පැන් සහ විදේශීය ආනයනික මත්පැන් බෝතල් මත ව්‍යාජ ආරක්ෂිත මුද්‍රා යෙදීම පිළිබඳව වැටලීම් සිදු කිරීම පුළුල් කිරීම.
- මත්පැන් බෝතල් මත අලවන ආරක්ෂිත මුද්‍රාව වැඩිදියුණු කොට ආරක්ෂිත සළකුණු වල වර්ණය හා නිර්මාණය වෙනස් කර මේ වන විටත් මත්පැන් නිෂ්පාදනාගාර සඳහා නිකුත් කරමින් පවතී. ව්‍යාජ ස්ටිකර් හඳුනා ගැනීම සඳහා MSP ආයතනය විසින් නව මෘදුකාංගයක් ඉදිරියේදී හඳුන්වා දීමට නියමිත අතර එමඟින් ව්‍යාජ ස්ටිකර් සහිත මත්පැන් බෝතල් වෙළඳපොල තුළ පැවතීම අවම කිරීම මඟින් රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ.

- ඩිජිටල් කේත මුද්‍රණයේ නිරවද්‍යතාවය ඉහළ නැංවීමට නව යන්ත්‍ර ස්ථාපනය කිරීම මේ වනවිට ආරම්භ කර ඇති අතර ව්‍යාජ ස්ටිකර් සංසරණය වීම වැළැක්වීම සඳහා ද නව ආකෘතියෙන් යුක්ත ස්ටිකර් මේ වනවිට හඳුන්වා දී ඇති අතර තවද MSP ආයතනය මඟින් ව්‍යාජ ස්ටිකර් හඳුනා ගැනීම සඳහා නව ජංගම මෘදුකාංගයක් හඳුන්වා දීම.

- ආරක්ෂිත සලකුණු සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි හා තාක්ෂණික ගැටළු සම්බන්ධව වඩාත් ඵලදායීව ක්‍රියා කිරීම සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ලබා ගැනීමට කටයුතු කිරීම.

ගුණාත්මකභාවයෙන් හා ප්‍රමාණාත්මකභාවයෙන් ඉහළ ග්‍රහණ ඉලක්ක සිදුකර සුරාබදු ආදායම ඉහළ දැමීම.

- නීත්‍යානුකූල නොවන මත්පැන් ව්‍යාප්ත වීම පාලනය කිරීම මඟින් මත්පැන් නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා 2025 වර්ෂයේදී දිවයින පුරා අපරාධ වාර්තා ග්‍රහන 36,000 ක් සහ කාර්මික අපරාධ වාර්තා 4,000 ක් සිදු කිරීමට සුරාබදු නිලධාරීන්ට ඉලක්ක ලබා දීම හා මාසිකව සමාලෝචනය කිරීම

- පූගොඩ සුරාබදු ස්ථානයට අනුබද්ධව දෙපාර්තමේන්තුවට අයත් නවීන ගොඩනැගිල්ලක මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එහි ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදන මුදලක් 2023 අයවැය යෝජනා මගින් අනුමත වූ අතර 2024 වර්ෂය වන විට එහි කටයුතු අවසන් අදියරේ පවතින බැවින් මධ්‍යම රසායනාගාරය 2025 වර්ෂයේදී විවෘත කිරීමේ කටයුතු සිදුකිරීම.

- මත්ද්‍රව්‍ය හා සම්බන්ධ ග්‍රහණයන් සිදුකරමින් සමාජ ආරක්ෂණ කටයුතු කිරීම.

දිවයින පුරා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සිදුකරමින් මතින් තොර ශ්‍රී ලංකාවක් ගොඩනැඟීමට අවශ්‍ය පියවර ගැනීම

හිඟ බදු අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ හා මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය අනුව අයකර ගැනීමට පියවර ගැනීම.

- හිඟ බදු ගෙවිය යුතු බලපත්‍රධාරීන්ගේ බලපත්‍රය හා නිෂ්පාදන කටයුතු අත්හිටුවීමත් ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අදාල පනත් සංශෝධනය කර නීතිගත කිරීම.

- අපතය මත අය කෙරෙන බදු කළමනාකරණය කිරීම සඳහා අපතයන් සම්බන්ධව ප්‍රායෝගික ප්‍රතිශතයන් හඳුන්වා දී සුරාබදු නිවේදනයන් නිකුත් කිරීම.

රාජකාරී කටයුතු කාර්යක්ෂමව කරගැනීම සඳහා නව වාහන මිලදී ගැනීම සහ ස්ථිර ගොඩනැඟිලි ඉදිකිරීම

- පැරණි වාහන අලුත්වැඩියා කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන බැවින් නව වාහන මිලදී ගැනීම.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 25 ක් කුලී පදනම මත සිය මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබමින් පවතින අතර මෙම ස්ථාන සඳහා රජයේ ගොඩනැඟිලි සොයා ගැනීම හෝ නව ගොඩනැගිලි ඉදිකිරීම.

සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනයවීම සංචාරක මණ්ඩලය අනුමත ර.බි. 7/8 , ර.බි. 11 , 22 බී හා බුටික් විලා බලපත්‍ර ලබාදීම.

අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) මඟින් නිලධාරීන් සම්බන්ධව ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධ පියවර ගැනීම.

යෝජිත RASED පද්ධතියේ සියලු අවශ්‍යතා හඳුනාගෙන එම මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කර ගැනීම සඳහා සේවාදායකයකු ජාතික විවෘත ප්‍රසම්පාදනයක් තුලින් තෝරාගත් අතර ඒ අනුව, මෘදුකාංග සංවර්ධන කටයුතු මොඩියුල ආකාරයෙන් සිදු කිරීමට හා දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් දියුණු කිරීම.

2 : 2 :2 අභියෝග

නීතිවිරෝධී මත්පැන් රට තුළ සංසරණය වීම හා ආරක්ෂිත සලකුණු මුද්‍රා සහිත ව්‍යාජ ස්ටිකර් සහිත මත්පැන් වෙළඳපොලට නිකුත් කිරීම.

- ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ආරම්භයේදී විවිධ ගැටළු ඇති වුවත් ඒවා අවම කර ගනිමින් මේ වනවිට සියලුම මත්පැන් බෝතල් මත ස්ටිකරය හා ඩිජිටල් කේතය යෙදීම ක්‍රියාත්මක වේ. නමුත් ඩිජිටල් කේත මුද්‍රණයේදී ඇතිවන දෝෂ හා ව්‍යාජ ස්ටිකර් වෙළඳපොල තුළ සංසරණය වීම දෙපාර්තමේන්තුව මුහුණ පාන විශාල අභියෝගයන් වේ.

එමෙන්ම ගෘහස්ථ කර්මාන්තයක්ව පවතින බීඩි නිෂ්පාදනය නියාමනය කිරීම හා තෙන්දු කොළ මත ආනයනික බදු පැනවීම මඟින් නීති විරෝධී ලෙස මුහුදු මාර්ගයෙන් තෙන්දු කොළ ආනයනය ද විශාල අභියෝගයක්ව පවතී.

දිවයින පුරා වැටලීම් සිදු කිරීම සඳහා පවතින ද්විතීක හා තෘතීක නිලධාරි හිඟය නිසා ඇතිවන බලපෑම.

- සමස්ත දෙපාර්තමේන්තුවේ රාජකාරි කරනු ලබන නිල ඇඳුම් කාර්යය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ විශ්‍රාම යාම හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ ඉහළ නිලධාරීන්ගේ හිඟයක් පැවතීම නිසා ආදායම් එකතු කිරීම විශාල අභියෝගයකි. එමෙන්ම තෘතීය ද්විතීය මට්ටම්වල නිලධාරීන්ගේද විශාල හිඟයක් පවතී.

දැනට දෙපාර්තමේන්තුව සතු වාහන වලින් 70% ක් පමණ වසර 20 කට වඩා පැරණි වාහන බැවින් එම වාහන අලුත්වැඩියා කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.

මත්පැන් නිෂ්පාදනයේදී භාවිතයට ගන්නා හිස් බෝතල් හා හිස් බියර් ටින් (බියර් කැන්) නිසි ලෙස එකතු කිරීම හා ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම පිළිබඳ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විශේෂ අවධානය යොමු කර මේ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය හා ඊට අදාළ බාහිර ආයතන සමග සාකච්ඡා කර මත්පැන් අලෙවිසැල් ආඝන්නයේ යකඩ යොදා සකසන ලද කූඩා සවි කිරීම සිදු කරන ලදී. මෙහිදී එකතු වන හිස් බියර් ටින් ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ කටයුතු නියාමනය කිරීම.

2:3 සුභසාධනය

2.3.1 කාර්යාලීය සුභසාධනය

- රාජ්‍ය ආදායම වර්ධනය සඳහා කැපවන සුරාබදු දෙපාර්තමේන්තුවේ රාජකාරි කරන සියලුම කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය සඳහා දිරි දීමනාවක් (මූලික වැටුපෙන් 25%) ලබා දීමට මුදල් අමාත්‍යාංශය වෙත යෝජනාවක් ඉදිරිපත් කරන ලද අතර කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් පසුව 2024 වර්ෂයේ සිට එම දිරි දීමනා ගෙවීම සිදු කරන ලදී.

- ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවක සුභසාධනය සඳහා ආපන ශාලාවක් 2024 වර්ෂයේ දී පවත්වා ගෙන යන ලදී.

2.3.2 ක්‍රීඩා

2024 රාජ්‍ය සේවා මලල ක්‍රීඩා උළෙල

කාන්තා යගුලිය දැමීම
වයස අවුරුදු 20-30 කාණ්ඩය
3 වන ස්ථානය
කාන්තා සුරාබදු කෝප්‍රල් W. J මහේෂිකා

110M කඩුලු මතින් දිවීම
වයස අවුරුදු 31-40 කාණ්ඩය
3 වන ස්ථානය
සුරාබදු පරීක්ශක M D T අමිලතිස්ස

400M කඩුලු මතින් දිවීම
3 වන ස්ථානය
සුරාබදු කෝප්‍රල් L.N කෝදාගොඩ



100m x 4 සහය දිවීම (පිරිමි)
3 වන ස්ථානය
සුරාබදු පරීක්ශක M D T අමිලතිස්ස
සුරාබදු පරීක්ශක D L J N ලියනගේ
සුරාබදු කෝප්‍රල් B S කුමාර
සුරාබදු කෝප්‍රල් L N කෝදාගොඩ

උස පැනීම
වයස අවුරුදු 51-60 කාණ්ඩය
1 වන ස්ථානය
සුරාබදු පරීක්ශක J G S විජේරත්න

දුර පැනීම
1 වන ස්ථානය
සුරාබදු පරීක්ශක J G S විජේරත්න

2024 රාජ්‍ය සේවා ක්‍රිකට් තරඟාවලිය

1. සුරාබදු A කණ්ඩායම සමඟ දකුණු පළාත් සභා A කණ්ඩායම අතර තරඟය
   ජයග්‍රහණය සුරාබදු A කණ්ඩායම
2. සුරාබදු A කණ්ඩායම සමඟ බන්ධනාගාර A කණ්ඩායම අතර තරඟය
   ජයග්‍රහණය සුරාබදු A කණ්ඩායම



3. සුරාබදු H කණ්ඩායම සමඟ ලංකා තේ මණ්ඩල H කණ්ඩායම අතර තරඟය
   ජයග්‍රහණය - සුරාබදු H කණ්ඩායම
4. සුරාබදු H කණ්ඩායම සමඟ ලංකා විදුලිබල මණ්ඩල H කණ්ඩායම
   ජයග්‍රහණය - සුරාබදු H කණ්ඩායම



පරිච්ඡේදය - 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය- සුරාබදු තෑගි අරමුදල

3.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල

3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල

3.7 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.8 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

3.9 මු.රෙ.**208** ප්‍රකාරව, දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ලෙස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව **2024** වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.10 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.11 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව - ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - ඇමුණුම - **01**

3.12 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව - සුරාබදු තෑගි අරමුදල - ඇමුණුම - **02**

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)

ඒසීඒ-එෆ්

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	තත්‍ය 2024	2023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**			-	
-	ආදායම් බදු	**1**	-	-	
232,000,000,000.00	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	214,583,521,358.00	171,273,655,832.00	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
232,000,000,000.00	**මුළු ආදායම් ලැබීම් (අ)**		**214,583,521,358.00**	**171,273,655,832.00**	
-	**ආදායම් නොවන ලැබීම්**		**3,449,024,290.00**	**1,764,656,721.00**	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,209,570,000.00	1,458,000,959.00	ඒසීඒ-3
-	තැන්පතු		1,188,778,755.00	254,662,745.00	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		50,675,535.00	51,993,017.00	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**3,449,024,290.00**	**1,764,656,721.00**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**218,032,545,648.00**	**173,038,312,553.00**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		215,512,702,254.00	169,672,076,255.00	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		2,519,843,394.00	3,366,236,298.00	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		**2,356,782,858.00**	**3,049,367,108.00**	
1,055,364,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලා	**5**	1,053,091,312.00	888,601,238.00	
1,352,300,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	1,298,271,015.00	2,154,636,847.00	ඒසීඒ-2(ii)
7,000,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	5,420,531.00	6,129,023.00	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
2,414,664,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**2,356,782,858.00**	**3,049,367,108.00**	
	මූලධන වියදම්		**126,911,122.00**	**235,218,685.00**	
67,400,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	40,661,243.00	33,555,451.00	
987,750,686.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	77,349,931.00	196,488,034.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
20,000,000.00	හැකියා වර්ධනය	**14**	8,899,948.00	5,175,200.00	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
1,075,150,686.00	**මුළු මූලධන වියදම් (උ)**		**126,911,122.00**	**235,218,685.00**	
	තැන්පතු ගෙවීම්		149,842,627.00	202,366,622.00	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		39,702,842.00	38,729,596.00	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**189,545,469.00**	**241,096,218.00**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**2,673,239,449.00**	**3,525,682,011.00**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(153,396,055.00)	(159,445,713.00)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(153,849,812.00)	(159,445,713.00)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		453,757.00		ඒසීඒ-3
			(153,396,055.00)	(159,445,713.00)	
			-		

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (2024 දෙසැම්බර් 31 දිනට)

ඒසිඒ-පි

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කළඹ 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,290,807,260.00	2,179,655,327.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	131,325,930.00	142,298,622.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	453,757.00	-
මුළු වත්කම්		**2,422,586,947.00**	**2,321,953,949.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(1,284,877,933.00)	(234,969,113.00)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,290,807,260.00	2,179,655,327.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	1,416,203,863.00	377,267,735.00
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	453,757.00	-
මුළු වගකීම්		**2,422,586,947.00**	**2,321,953,949.00**

පිටු අංක 06 සිට 34 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක 35 සිට 63 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන **පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :කේ.එම්.මහින්ද සිරිවර්ධන	නම :යූ.එල්.උදය කුමාර පෙරේරා	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :ලේකම්	තනතුර :සුරාබදු කොමසාරිස් ජනරාල්	නම :ජී.අජිතා චාන්දනී
දිනය : 2025.02.28	දිනය :	දිනය : 2025/2/18
කේ.එම්.මහින්ද සිරිවර්ධන	යූ.එල්. උදය කුමාර පෙරේරා	ජී. අජිතා චාන්දනී
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තු	සභූරාබදු කොමසාරිස් ජනරාල් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව අංක. 353, කෝට්ටේ පාර, 2 රාජගිරිය.	ප්‍රධාන මූල්‍ය නිලධාරි ශ්‍රී ලංකා [illegible] දෙපාර්තමේන්තුව [illegible], කෝට්ටේ පාර, [illegible].
මුදල් අමාත්‍යාංශය [illegible] 01.		

CS Scanned with CamScanner

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

		එස්එල්-සී
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	තක්‍ෂ	
	2024 රු.	**2023** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්	214,583,521,358.00	171,273,655,832.00
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	118,189,880.00	135,663,272.00
අග්‍රිම ලැබීම්	2,209,570,000.00	1,458,000,959.00
අත්තිකාරම් අයකර ගැනීම්	42,856,171.00	44,682,987.00
තැන්පතු ලැබීම්	1,188,778,755.00	254,662,745.00
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**218,142,916,164.00**	**173,166,665,795.00**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,346,072,472.00	3,037,900,985.00
සහනාධාර සහ මාරුකිරීම්	5,420,531.00	6,129,023.00
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,013,843.00	7,223,672.00
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	215,512,702,254.00	169,672,076,255.00
අත්තිකාරම් ගෙවීම්	31,574,501.00	31,320,831.00
තැන්පතු ගෙවීම්	149,842,627.00	202,366,622.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**218,047,626,228.00**	**172,957,017,388.00**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-	**95,289,936.00**	**209,648,407.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	94,836,179.00	210,039,366.00
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**94,836,179.00**	**210,039,366.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-	**(94,836,179.00)**	**(210,039,366.00)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**453,757.00**	**(390,959.00)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**453,757.00**	**(390,959.00)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**453,757.00**	**-**

3.4 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - සුරාබදු තෑගි අරමුදල
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
(රුපියල් වලින්)

	2024	2023
අයභාරය		
සමථ ගාස්තු ලැබීම්	159,642,538	162,558,319
සිගරට් සමථ ගාස්තු ලැබීම්	4,254,400	10,732,540
මුළු අයභාරය	**163,896,938**	**173,290,859**
වියදම්		
තෑගි මුදල් ගෙවීම්	36,860,836	89,465,894
රජයේ ආදායමට ගෙවීම් - සමථ ආදායම 15%	23,946,381	24,383,747
රජයේ ආදායමට ගෙවීම් - සිගරට් සමථ 75%	3,190,800	8,049,405
දුම්කොළ අරමුදලට වෙන් කිරීම	1,063,600	2,683,136
විශේෂ වැටලීම්		-
වෙනත් ගෙවීම්		
කපා හැරීම්		32,755
ක්ෂයවීම් (උපලේඛන 01)	11,421,663	11,707,328
බලපත්‍රලාභීන්ට නැවත ගෙවීම්	5,000	-
මුළු වියදම්	**76,488,280**	**136,322,265**
අතිරික්තය / (ඌනතාවය)	**87,408,658**	**36,968,594**

සකස් කළේ:-

පරීක්ෂා කළේ:-

ජී. අජිතා චාන්දනී
ප්‍රධාන මූල්‍ය නිලධාරී

ජී. අජිතා චාන්දනී
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

Scanned with CamScanner

02

3.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - සුරාබදු තැගි අරමුදල

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - සුරාබදු තැගි අරමුදල
2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ඒකකය රුපියල්	2024	2023
වත්කම්		
ජංගම වත්කම්		
සමථ ලැබීම් සහ ගෙවීම් ගිණුම	311,340,660	229,635,702
ලැබිය යුතු සමථ ගාස්තු	-	-
ලැබිය යුතු සිගරට් දඩ සමථ ගාස්තු	-	-
	311,340,660	229,635,702
ජංගම නොවන වත්කම්		
ඉඩම් හා ගොඩනැගිලි (උපලේඛන 02)	47,134,000	47,134,000
වාහන (උපලේඛන 03)	454,771	606,361
ලී බඩු සහ උපකරණ (උපලේඛන 04)	6,879,101	9,172,135
විදුලි උපකරණ (උපලේඛන 05)	4,223	5,280
කාර්යාල උපකරණ (උපලේඛන 06)	42,654,489	44,858,986
ක්‍රීඩා භාණ්ඩ (උපලේඛන 07)	2,011	2,514
සුස්තනාල පොත් (උපලේඛන 08)	13,034	16,293
වෙනත් උපකරණ (උපලේඛන 09)	2,972	3,397
ක්ෂය වත්කම් මිලට ගැනීම	-	-
ක්ෂය සංචිත අරමුදල	42,103,687	30,682,023
	139,248,288	132,480,989
මුළු වත්කම්	450,588,948	362,116,691
බැරකම්		
කෙටිකාලීන බැරකම්		
රජයේ ආදායමට ගෙවිය යුතු සමථ මුදල්	-	-
රජයේ ආදායමට ගෙවිය යුතු සිගරට් සමථ මුදල්	-	-
දුම්කොළ අරමුදලට ගෙවිය යුතු මුදල්	-	-
ගෙවිය යුතු තැගි මුදල්	-	-
දීඝකාලීන බැරකම්		
දුම්කොළ අරමුදලට ගෙවිය යුතු අරමුදල්	25,427,350	24,363,751
ඉදිරි වත්කම්	425,161,598	337,752,940
ඉදිරි වත්කම් /ස්කන්ධය		
සමුච්චිත අරමුදල	337,752,940	300,719,620
පෙර වර්ෂයේ ගැලපීම්		64,726
අතිරික්තය / (ඌනතාවය)	87,408,658	36,968,594
මුළු ස්කන්ධය	425,161,598	337,752,940

සකස් කළේ:-

පරීක්ෂා කළේ:-

පිටු අංක 06 සිට 07 දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 18 සිට 53 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ සමස්ථයක කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීම හා ඉදිරිපත් කිරීමේ වගකීම පරිපාලන කාරක සභාව සතුය. ඒ අනුව 2024 වර්ෂයට අදාළව පිළියෙල කළ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන පරිපාලන කාරක සභාව අනුමත කරවූ .

රෝහණ සේනාරත්න
අතිරේක සුරාබදු කොමිසාරිස් ජනරාල්
Rohana Senaratne
Additional Commissioner General Of Excise
(Revenue Policy & Administration)
Excise Department of Sri Lanka
No. 353, Kotte Road, Rajagiriya.

තිස්ස කුමාර රාජපක්ෂ
නියෝජ්‍ය සුරාබදු කොමිසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්)
Thissa Kumara Rajapakshe
Deputy Commissioner of Excise (Law Enforcement)
Excise Head Office
No. 353, Kotte Road,
Rajagiriya.

යූ.වල්. උදය කුමාර පෙරේරා
සුරාබදු කොමිසාරිස් ජනරාල්

යූ.වල්. උදය කුමාර පෙරේරා
සුරාබදු කොමිසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353. කෝට්ටේ පාර.
රාජගිරිය.

Scanned with CamScanner

3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය - සුරාබදු තෑගි අරමුදල

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - සුරාබදු තෑගි අරමුදල
2024 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
(රුපියල් වලින්)

	2024	2023
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
ලැබීම්		
සමථ ගාස්තු ලැබීම්	159,642,538	172,209,513
සිගරැට් සමථ මුදල් ලැබීම්	4,254,400	11,692,940
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුළු ලැබීම්	**163,896,938**	**183,902,453**
ගෙවීම්		
සමථ තෑගි මුදල්	36,860,836	96,704,291
රජයේ ආදායමට	27,137,181	34,601,132
විශේෂ වැටලීම් සඳහා		-
ක්ෂය සංචිත අරමුදලට (උපලේඛන 01)		11,707,328
බලපත්‍රලාභීන්ට නැවත ගෙවීම	5,000	-
වෙනත්		3,771,335
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුළු ගෙවීම්	**64,003,017**	**146,784,086**
ශුද්ධ මුදල් ප්‍රවාහය	**99,893,921**	**37,118,367**
ආයෝජන ක්‍රියාකාරක වලින් වූ මුදල් ප්‍රවාහයන්		
හයිඩ්‍රෝමීටර් මිලදී ගැනීම	(6,767,300)	
ක්ෂය සංචිත අරමුදලට (උපලේඛන 01)	(11,421,663)	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(18,188,963)**	
මුදල්වල ශුද්ධ වැඩිවීම / අඩුවීම	81,704,958	37,118,367
කාල පරිච්ඡේදය ආරම්භයේ වූ මුදල්	229,635,702	192,517,335
2024.12.31 දිනට මුදල් ශේෂය	**311,340,660**	**229,635,702**

සකස් කළේ:-

පරීක්ෂා කළේ:-

ජී. අජිතා චාන්දනී
ප්‍රධාන මූල්‍ය නිලධාරී

පී. අජිතා චාන්දනී
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

3.7 මූල්‍ය ප්‍රකාශ සටහන්

ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතය විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	අවසන් ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස
1002.04.01	මත්පැන්	230,000,000,000.00	230,000,000,000.00	213,389,597,989.00	92.78
1002.06.00	දුම්කොළ බද්ද	2,000,000,000.00	2,000,000,000.00	1,193,923,369.00	59.70

3.8 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		නත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක්(%)ලෙස
	මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)	(රු.)	
පුනරාවර්තන	2,310,500,000.00	2,414,664,000.00	2,356,782,858.00	97.60
ප්‍රාග්ධනය	1,068,700,000.00	1,075,150,686.00	126,911,122.00	11.80

3.9 මු.රෙ.208 ප්‍රකාරව, දෙපාර්තමේන්තු නියෝජිතයෙකු ලෙස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 2024 වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

නැත.

3.10 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය (රු.)	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම.
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	530,597,207.71	530,597,207.71		100%
9152	යන්ත්‍රෝපකරණ	907,804,584.29	907,804,584.29		100%
9153	ඉඩම්	403,505,000.00	403,505,000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	3,803,200.00	3,803,200.00		100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		-
9160	කෙරිගෙන යන වැඩ	190,803,318.24	190,803,318.24		100%
9180	බදු දෙන ලද වත්කම්	254,293,950.00	254,293,950.00		100%

3.11 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
ඇමුණුම - 01

3.12 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව - සුරාබදු තෑගි අරමුදල
ඇමුණුම - 02

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PUR/E/EXD/FA/ 2024/01 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 29 දින

සුරාබදු කොමසාරිස් ජනරාල්

සුරාබදු දෙපාර්තමේන්තුව

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව සහ සහතික කරන ලද 2024 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ඊ.එම්.කේ.එම්.පද්මලාල්

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

ජ. එම්. කේ. එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල.

පිටපත් :- 1. අධ්‍යක්ෂක ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

2. ලේකම්, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PUR/E/EXD/FA/ 2024/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 29 දින

සුරාබදු කොමසාරිස් ජනරාල්
සුරාබදු දෙපාර්තමේන්තුව

30 MAY 2025
සුරාබදු කොමසාරිස් ජනරාල් කාර්යාලය

යූ.එල්. උදය කුමාර පෙරේරා
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි මස 29 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව සුරාබදු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මත්පැන් අපනයනය මත සුරාබදු මුදල් අවකරණය

(අ) 2024 වර්ෂයට අදාලව නිෂ්පාදනාගාර විසින් දේශීයව නිපදවන මත්පැන් අපනයනය මත වූ බදු අවකරණ වටිනාකම අදාල නිෂ්පාදන බදු වලින් අඩුකර ශුද්ධ සුරාබදු ආදායම පමණක් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගතකර තිබුණි. මේ අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ මත්පැන් මත බදු ආදායම රු. 12,194,197,179 කින් පමණ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) අපනයනය කරන මත්පැන් වලට අදාල බදු මුදල් ආපසු ගෙවීම ගිණුම්ගත කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට සුදුසු වැය විෂයයක් (Vote) හා අවශ්‍ය ප්‍රතිපාදන සහ එම වැය විෂයය මඟින් අදාල සුරාබදු අවකරණ මුදල ගිණුම්ගත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබානොදීම මත සුරාබදු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු. 12,194,197,179 කින් පමණ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.6.2 මූලධන වියදම්

සුරාබදු තැගි අරමුදලේ වත්කමක් වන පනාදරගම සුරාබදු අභ්‍යාස විද්‍යාලයේ ගොඩනැගිලි අළුත්වැඩියාවක් සඳහා වූ රු. 2,010,657 ක් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දරා තිබුණු අතර එය සුරාබදු දෙපාර්තමේන්තුවේ 2001 ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි.

1.6.3 තැන්පතු ගෙවීම්

කාර්මික අපරාධ වාර්තා වෙනුවෙන් සමථ ගාස්තු අයකර ගැනීම සඳහා තැන්පත් කල රු. 5,285,845 ක් හා අනෙකුත් තැන්පතු වෙනුවෙන් තැන්පත් කල රු. 203,500 ක් ලෙස එකතුව රු. 5,489,345 ක තැන්පතු ශේෂයන් 2024 දෙසැම්බර් 31 දින වන විට පියවා අවසන් කර තිබුණද, එම ශේෂයන් තව දුරටත් තැන්පත් ගිණුම් අංක 6000-0-0-0-1-0-122-0 ඇප තැන්පතු ගිණුම යටතේ දක්වා තිබුණි.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

(අ) සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල ඉඩම් වටිනාකම රු. 282,680,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල ගොඩනැගිලි වටිනාකම රු. 259,470,329 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2024 වර්ෂයේ සුරාබදු තැගි අරමුදල යටතේ මිලදීගත් රු. 6,767,300 ක වටිනාකමැති "හයිඩ්‍රොමීටර්" 25 ක් සුරාබදු දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හා උපකරණ තුල වූ රසායනාගාර උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල කෙරීගෙන යන වැඩ (WIP) වටිනාකම රු. 190,803,318 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල මූල්‍ය කල්බදු වත්කම් වටිනාකම රු. 153,111,371 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට පැවති අලවා සක්‍රීය නොකරන ලද ආරක්ෂිත සලකුණු වල පිරිවැය වූ රු. 36,120,593 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.6.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

මියගිය, වැඩ තහනම් කල හා සේවය අතහැර ගිය නිලධාරීන් 12 ගෙන් අයකර ගතයුතු වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු. 1,074,020 ක් විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොනිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1.(අ) iv	මත්පැන් අපනයනයට අදාලව බදු අවකරණය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති විධි විධාන පරිදි හා මුදල් රෙගුලාසි 118 අනුව කටයුතු කල යුතුය	1.6.1. (අ), (ආ)
2.1. (ඇ) ii	සුරාබදු අඥා පනත ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය	3.1. (ආ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 හිඟහිටි ආදායම්

(අ) සුරාබදු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල හිඟ ආදායම් රු. 24,442,751 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වසර 05 වඩා වැඩි කාලයක් පවතින හිඟ බදු ආදායම්

2024 දෙසැම්බර් 31 දිනට වසර 05 කට වැඩි කාලයක සිට ආයතන 05 කින් අයවිය යුතු හිඟ සුරාබදු ආදායම් රු.1,702,131,279 ක් හා ඒ සඳහා වූ ප්‍රමාද ගාස්තුව රු. 4,635,465,422 ක් ලෙස එකතුව රු. 6,337,596,701 ක් අයකරගත යුතු විය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
2023 අගොස්තු 08 දිනැති අංක 09/2023 දරන දූෂණ විරෝධී පනතේ 79 හා 80 වගන්ති	සුරාබදු දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් 301 දෙනෙකු විසින් වාර්ෂික වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දින වන විට ඉන් නිලධාරීන් 235 දෙනෙකු පමණක් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී තිබුණි. ඒ අනුව නිලධාරීන් 66 දෙනෙකු ඉහත පනත ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

3.3 තැන්පතු ගිණුම් ශේෂ

කාර්මික අපරාධ වාර්තා වෙනුවෙන් සමථ ගාස්තු අයකර ගැනීම සඳහා 6000-0-0-0-1-0-122-0 2001 තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබූ රු. 19,749,450 ක් වූ ඇප තැන්පතු ශේෂය හා තාවකාලික රදවාගැනීමේ තැන්පතු ගිණුමේ (6000-0-0-18-0-119-0) වසරකට වඩා පැරණි රු. 4,983,737 ක තැන්පතු ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් නොවී පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ගොඩනැගීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් 2106 වැය විෂයය යටතේ සුරාබදු දෙපාර්තමේන්තුව වෙත 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එකතුව රු. 1,041,800,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුනද, 2024 වර්ෂය අවසන් වන විට ඉන් කිසිදු මුදලක් උපයෝජනය කිරීමට දෙපාර්තමේන්තුවට හැකිවී නොතිබුණි.

(ආ) යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ගොඩනැගීම සඳහා ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සමස්ථ ක්‍රියාවලියම 2024 වර්ෂයේ සිට වසර 03 ක කාලයක් තුල සිදුකර අවසන් කලයුතු වුවත් ඒ සඳහා වූ අනුමත කල නිශ්චිත කාල රාමුවක් සකස් කර නොතිබුණි.

(ඇ) යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ගොඩනැගීම සඳහා පත්කල ප්‍රසම්පාදන කමිටුව විසින් (Standing High Level Procurement Committee) ප්‍රසම්පාදන ක්‍රියාවලියට පමණක් අදාල කාල රාමුවක් අනුමත කර තිබූ නමුත් 2025 පෙබරවාරි මස 05 දින පැවැත්වූ Pre – Bid Meeting හිදී ලංසු කැඳවීමේ අවසාන දිනය සති 03 ත් 04 ත් අතර කාලයකින් දීර්ඝ කිරීමට තීරණය කර තිබුණි. තවද අනුමත කර තිබූ ප්‍රසම්පාදන කාල රාමුවට අනුව 2025 අප්‍රේල් 29 වන විට අදාල ලංසු කැඳවා, එම ලංසු ඇගයීම් කර තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන අවසන් කල යුතු වුවද, 2025 මැයි 25 දින වන විටත් එම ලංසු වලට අදාල තාක්ෂණික ඇගයීම් කටයුතු සිදුකරමින් පැවතුනි.

(ඈ) සුරාබදු දෙපාර්තමේන්තුවට අදාලව බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය, නිෂ්පාදනාගාර අධීක්ෂණය, බෙදාහැරීම් සහ සැපයුම් දාම නියාමනය, අපරාධ දත්ත හා නීති කළමනාකරණය, සුරාබදු සහ බදු පරිපාලනය ආදී වැදගත් ක්ෂේත්‍ර සඳහා යෝජිත පරිගණකගත දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සහ රේගු දෙපාර්තමේන්තුව, දේශීය ආදායම්

දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශයේ ක්‍රියාත්මක තොරතුරු පද්ධති සමඟ සම්බන්ධ වී තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ඒකාබද්ධ පද්ධතියක් හරහා සිදු කිරීමද තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුනි.

4.2 පාඩු හා හානි

(අ) මත්පැන් නිෂ්පාදනාගාරයක සිදුවූ ගිනි ගැනීමෙන් ආරක්ෂිත සලකුණු විනාශ වීම.

මත්පැන් නිෂ්පාදනාගාරයක 2024 මැයි මස 26 දින සිදුවූ ගිනි ගැනීම සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පත්කල පරීක්ෂණ කමිටුව මඟින් ඉදිරිපත් කල වාර්තාවේ සඳහන් පහත නිර්දේශ හා නිගමන වලට අනුව කටයුතු කර නොතිබුණි.

i. රජයේ රස පරීක්ෂක මැයි මස වරයා විසින් 2024 ජූලි 03 දින සිදුකල පරීක්ෂණයෙන් පසු 2024 අගෝස්තු 12 දින තම දින විශේෂඥ මතය පල කර තිබූ අතර රජයේ රස පරීක්ෂක වාර්තාවට අනුව මෙම ගිනි ගැනීම සිතාමතා සිදුකල ගිනි තැබීමක් බව නිරීක්ෂණය විය.

ii. ගිනි ගැනීමට ලක්වූ නිෂ්පාදනාගාරයේ සුරාබදු ස්ථානාධිපති ලෙස 2023 නොවැම්බර් 06 දින සිට 2024 ජනවාරි 16 දින දක්වා වූ කාලය තුල සේවය කල නිලධාරියා විසින් එම කාලයට අදාලව ප්‍රධාන කාර්යාලයෙන් ආරක්ෂිත සලකුණු 2,460,000 ක් ලබාගෙන තිබුණි. නමුත් 2024 ජනවාරි 16 දින අදාල නිලධාරියා විසින් නව ස්ථානාධිපතිවරයා වෙත ආරක්ෂිත සලකුණු 154,625 ක තොගයක් පමණක් බාරදී තිබුණි. ඒ අනුව අදාල කාල සීමාව තුල අවම වශයෙන් ආරක්ෂිත සලකුණු 2,305,375 ක් භාවිතා කර තිබුණි.

iii. සුරාබදු දෙපාර්තමේන්තුවේ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතියට අනුව 2024 මැයි 26 දින වන විට අදාල සමාගම සතුව අලවා සක්‍රිය නොකල ආරක්ෂිත සලකුණු 8,179,194 ක තොගයක් පැවතිය යුතුබවට නිරීක්ෂණය වුවත්, සුරාබදු ස්ථානාධිපතිවරයා පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු වලට අනුව 2024 මැයි 26 දින වන විට ආරක්ෂිත සලකුණු 1,396,988 ක් පමණක් පැවති බවට දක්වා තිබුණි.

iv. අදාල නිෂ්පාදනාගාරය සතුව පවතින ආරක්ෂිත සලකුණු ප්‍රමාණය 8,179,194 ක් වැනි එහි නිෂ්පාදනයට සාපේක්ෂව අසාමාන්‍ය අගයක් වනතුරුත් සුරාබදු දෙපාර්තමේන්තුවේ ආරක්ෂිත සලකුණු කළමණාකරණ අංශයේ වගකිව යුතු නිලධාරීන් විසින් අදාල සමාගමේ සාමාන්‍ය නිෂ්පාදන ප්‍රමාණය හා අතැති ආරක්ෂිත

සලකුණු තොගය පිළිබඳව කිසිදු අවධානයක් යොමු නොකර සහ අදාල ආරක්ෂිත සලකුණු සම්බන්ධ භෞතික පරීක්ෂාවකින් තොරව, ආරක්ෂිත සලකුණු එම සමාගම වෙත නිකුත් කර තිබුණි.

v. ආරක්ෂිත සලකුණු භාරව අදාල නිෂ්පාදනාගාරයේ සුරාබදු කාර්යාලයට අනුයුක්තව කටයුතු කල එක් එක් නිලධාරියා විසින් තම රාජකාරී භාරගන්නා විට භාරගත් ආරක්ෂිත සලකුණු තොගය, ඔහුගේ රාජකාරී කාලය තුල ඇණවුම් කල ආරක්ෂිත සලකුණු ප්‍රමාණය, එම කාල සීමාවට අදාල නිෂ්පාදන ප්‍රමාණය හා අදාල ආරක්ෂිත සලකුණු භාරව කටයුතු කල නිලධාරියා ඉවත් වන විට නව නිලධාරියා වෙත භාරදුන් ආරක්ෂිත සලකුණු තොගය සම්බන්ධයෙන් පුළුල් විමර්ශණයක් සිදුකර ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතියට අනුව 2024 මැයි 26 දින වන විට පවතින ආරක්ෂිත සලකුණු ප්‍රමාණය හා පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු වලට අනුව 2024 මැයි 26 දින වන විට පැවති ආරක්ෂිත සලකුණු ප්‍රමාණය අතර ආරක්ෂිත සලකුණු 6,782,186 ක වෙනසක් පැවතීමට හේතු නිශ්චය කර වගකිව යුත්තන් අනාවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

vi. ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතියට අනුව 2024 මැයි 26 දින වන විට පවතින ආරක්ෂිත සලකුණු ප්‍රමාණය 8,179,174 ක් වූ අතර එදින සිදුවූ ගිනි ගැනීමෙන් අදාල නිෂ්පාදනාගාරය සතු සියළුම ආරක්ෂිත සලකුණු තොග විනාශ වී ඇති බව වාර්තා කර තිබුණි. ඒ අනුව අදාල මුළු ආරක්ෂිත සලකුණු ප්‍රමාණය මත රජයට අහිමි වන උපරිම සුරාබදු මුදල රු. 4,117,520,819 ක් ලෙස ගණනය කර තිබූ අතර එම වටිනාකමින් සත්‍ය වශයෙන්ම රජයට අයවිය යුතු ප්‍රමාණය තීරණය කර එම වටිනාකම එකී නිෂ්පාදන ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

vii. 2024 වර්ෂය සඳහා අදාල නිෂ්පාදනාගාරය සඳහා නිෂ්පාදන බලපත්‍රය නිකුත් කිරීමේදී ගිනි ආරක්ෂණයට අදාල ආයතනයක් මඟින් නිකුත් කල ගිනි ආරක්ෂණ සහතිකයක් ඉදිරිපත් කර තිබුණු අතර අදාල ගිනි ගැනීම සිදුවන අවස්ථාවේදී එම ගිනි ආරක්ෂණ පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි.

viii. නිෂ්පාදනාගාරය තුල CCTV පද්ධතියක් ස්ථාපිත කර තිබුණත් අදාල සිදුවීම සිදුවනදින වන විට එම පද්ධතිය ක්‍රියාකාරී තත්වයේ නොපැවති අතර අදාල නිෂ්පාදනාගාරයට අනුයුක්තව සේවය කල සුරාබදු නිලධාරීන් සමාගම ලවා එම CCTV පද්ධතිය අළුත්වැඩියා කරවීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) ව්‍යාජ මත්පැන් බෝතල් හා ස්ප්‍රිතු තොග අත්අඩංගුවට ගැනීම

මත්පැන් නිෂ්පාදනාගාරයකට අයත් ලොරි රථ 3 ක් තුල ස්ප්‍රිතු බැරල් 25 ක් හා මත්පැන් බෝතල් 8,446 ක් පෞද්ගලික පරිශ්‍රයක තිබියදී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පත්කල පරීක්ෂණ කමිටුව මඟින් ඉදිරිපත් කල වාර්තාවේ සඳහන් පහත නිර්දේශ හා නිගමන වලට අනුව කටයුතු කර නොතිබුණි.

i. ස්ප්‍රිතු ලබාගැනීම සඳහා මත්පැන් නිෂ්පාදන සමාගම විසින් ඉදිරිපත් කර තිබූ 2024.04.22 දිනැති අංක 2024/04/22/LS හා 2024.05.21 දිනැති අංක 2024/05/21/LS දරන ස්ප්‍රිතු ලබා ගැනීමේ අවසර පත්‍ර දෙක සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල නීත්‍යානුකූල අවසර පත්‍ර නොවන බව අනාවරණය වී තිබුණි. ඒ අනුව එම කුට ලේඛණ ඉදිරිපත් කල සමාගමේ නිලධාරීන්ට හා අදාල කුට ලේඛණ සකස් කිරීමට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව කුට ලේඛණ සැකසීම, රාජ්‍ය ආයතනයකට එම ලේඛණ ඉදිරිපත් කිරීම හා අදාල කුට ලේඛණ ඉදිරිපත් කර රජයට අයවිය යුතු බදු මුදල් සැලසුම්සහගතව පැහැර හැරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. අදාල මත්පැන් නිෂ්පාදනාගාරය වෙත 2024 අප්‍රේල් මස 17 දින සිට 2024 මැයි මස 22 දින දක්වා කාලය තුල පමණක් නිකුත් කල එහෙත් නිෂ්පාදනාගාරය තුල ලේඛණගත නොවූ ස්ප්‍රිතු ලීටර් 10,000 ක් මත්පැන් නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත්දැයි යන්න පිළිබඳව නිසි විමර්ෂණයක් සිදුකර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සහ අදාල ස්ප්‍රිතු ලීටර් 10,000 මත අයවිය යුතු මත්පැන් නිෂ්පාදන බද්ද වන රු. 70,418,400 ක මුදල හා ඒ මත අයවිය යුතු දඩ මුදල් අදාල සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

iii. අදාල මත්පැන් නිෂ්පාදනාගාරය විසින් 2024 අප්‍රේල් මස 17 දින සිට 2024 මැයි මස 22 දින දක්වා කාලය තුල ලබාගත් ස්ප්‍රිතු ලීටර් 15,000 ක් නිෂ්පාදනාගාරයේ තොග ලේඛණවල ඇතුලත් නොකර වංචාකාරී ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාල සමාගමට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

iv. මත්පැන් ලග තබා ගැනීම සඳහා බලපත්‍ර නොමැති පෞද්ගලික පරිශ්‍රයක තිබියදී අත්අඩංගුවට ගත් මත්පැන් බෝතල් 8,446 අදාල නිෂ්පාදනාගාරයේ බන්ධිත ගුදම් තුලින් නිකුත් කල මත්පැන් බෝතල් නොවන බවට සුරාබදු නිලධාරීන් විසින් ප්‍රකාශ

ලබා දී ඇති අතර මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අදාල මත්පැන් බෝතල් නිෂ්පාදනය කල ආකාරය හදුනා ගැනීමට හා ඔවුන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

v. අදාල නිෂ්පාදනාගාරයේ බන්ධිත ගුදම් තුලින් නිකුත් කල මත්පැන් බෝතල් නොවන බවට සුරාබදු නිලධාරීන් විසින් ප්‍රකාශ ලබා දී ඇති මත්පැන් බෝතල් 8,446 ක් තුල, සුරාබදු දෙපාර්තමේන්තුව විසින් එම සමාගම වෙත නීත්‍යානුකූලව නිකුත් කර ඇති, ආදාල නිෂ්පාදනාගාරයේ සුරාබදු නිලධාරීන් භාරයේ පවතින ආරක්ෂිත සලකුණු ඇලවූයේ කෙසේද යන්න පිළිබඳව විධිමත් විමර්ෂණයක් සිදුකර ඊට වගකිව යුතු පාර්ශවයන් හදුනාගැනීමට හා ඔවුන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

vi. අත්අඩංගුවට ගත් මත්පැන් බෝතල් 8,446 ක ප්‍රමාණය මත අයවිය යුතු රු. 4,171,991 ක බදු මුදල් හා ඒ මත අයවිය යුතු දඩ මුදල් අයකර ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

vii. සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉහල කළමණාකාරීත්වය විසින් ස්ප්‍රීතු ලබාගැනීමට අදාල ප්‍රධාන කාර්යාලය, ස්කාගාරය හා නිෂ්පාදනාගාරයේ නිලධාරීන් අතර ඵලදායී හා කාර්යක්ෂම සන්නිවේදනයක් ඇතිවන ආකාරයෙන් සහ මත්පැන් නිෂ්පාදනය හා බෙදාහැරීම හා ආරක්ෂිත සලකුණු කළමණාකරණය සම්බන්ධයෙන් සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

(අ) ව්‍යාජ ආරක්ෂිත සළකුණු

2024 ජනවාරි හා පෙබරවාරි මාස වල සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් උතුරු හා නැගෙනහිර පළාත්වල සිදුකරණ ලද විමර්ෂණ සම්බන්ධයෙන් පහත කරුණු විගණනයේදී නිරීක්ෂණය විය.

i. 2024 ජනවාරි හා පෙබරවාරි යන මාස වල සිදුකල විශේෂ විමර්ශනය තුලින් අත්අඩංගුවට ගත් මත්පැන් බෝතල් 54,887 අතුරින් ව්‍යාජ ආරක්ෂිත සළකුණු අලවා ඇතිද යන්න පරීක්ෂා කිරීම සඳහා සාම්පල් ලෙස මත්පැන් බෝතල් 418 ක් ඉදිරිපත් කර තිබූ අතර එම සාම්පල් ලෙස ඉදිරිපත් කල බෝතල් 418 ම ව්‍යාජ ආරක්ෂිත සලකුණු සහිත මත්පැන් බෝතල් බව තහවුරු වී තිබුණි. එලෙස ඉදිරිපත් කල සාම්පල්

වලින් සියළුම බෝතල් ව්‍යාජ ආරක්ෂිත සලකුණු සහිත මත්පැන් බෝතල් බවට තහවුරු වී තිබියදී අත්අඩංගුවට ගත් මත්පැන් බෝතල් 54,887 අතුරින් මත්පැන් බෝතල් 12,170 ක් පමණක් ව්‍යාජ ආරක්ෂිත සලකුණු සහිත මත්පැන් බෝතල් බවට හඳුනාගත් ආකාරය පිළිබඳ විගණනයට කරුණු අනාවරණය නොවුණි.

ii. ව්‍යාජ ආරක්ෂිත සලකුණු සහිත මත්පැන් බෝතල් වෙළඳ පොළට පැමිණීම සම්බන්ධයෙන් අදාල ව්‍යාජ ආරක්ෂිත සලකුණු මුද්‍රණය කිරීම හා නිෂ්පාදන ආයතන වෙත ලැබුණු ආකාරය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාල ව්‍යාජ ආරක්ෂිත සලකුණු මුද්‍රණය කරන ආයතන හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සහ රාජ්‍ය ආදායම් අහිමි කිරීම කටයුතු කිරීම හා වංචනිකව කටයුතු කිරීම සම්බන්ධයෙන් එම නිෂ්පාදන ආයතන වෙත නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

iii. උතුරු හා නැගෙනහිර පළාත් දෙක තුල තුල අහඹු ලෙස තෝරාගත් මත්පැන් අලෙවිසැල් 16 ක් තුල නිෂ්පාදන ආයතන 04 ට අදාල ව්‍යාජ ආරක්ෂිත සලකුණු සහිත මත්පැන් බෝතල් විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගත් පසුබිමක අදාල නිෂ්පාදනාගාර තුලින් නිපදවා ලංකාව පුරා බෙදාහරින මත්පැන් බෝතල් සම්බන්ධයෙන් දීපව්‍යාප්තව වහාම විශේෂ විමර්ෂණයක් සිදුකර වෙළඳ පොලේ ව්‍යාජ ආරක්ෂිත සලකුණු සහිත මත්පැන් බෝතල් පවතින්නේද යන්න අනාවරණය කරගත යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි.

iv. සියළු මත්පැන් නිෂ්පාදනාගාර හා නිෂ්පාදන ක්‍රියාවලිය සුරාබදු නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුවන පසුබිමක මෙලෙස ව්‍යාජ ආරක්ෂිත සලකුණු සහිත මත්පැන් බොතල් වෙළඳ පොළට නිකුත් වීම සම්බන්ධයෙන් අදාල නිෂ්පාදනාගාර හාරව කටයුතු කරන සුරාබදු නිලධාරීන් ගෙන් කරුණු විමසා ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යම රසායනාගාරය

සුරාබදු දෙපාර්තමේන්තුවේ මධ්‍යම රසායනාගාරය ඉදිකිරීම හා එයට අවශ්‍ය කාර්යාල උපකරණ හා රසායනාගාර උපකරණ ලබාගැනීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රු. 43,571,412 ක් වැය කර තිබූ අතර අදාල ඉදිකිරීම් කටයුතු අවසන් කර 2025 ජනවාරි මාසය තුල රසායනාගාරයේ අදාල පරීක්ෂණ කටයුතු සිදුකිරීම ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණත් මධ්‍යම රසායනාගාරයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා වන මානව සම්පත්

අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන නියමිත කාල රාමුවකට අනුව බඳවා ගැනීමට අපොහොසත් වීම මත මධ්‍යම රසායනාගාරයේ පරීක්ෂණ කටයුතු සිදු කිරීම ආරම්භ කර නොතිබුණි.

5. නව සුරාබදු බලපත්‍ර (ර.බී-04) නිකුත් කිරීම

සුරාබදු දෙපාර්තමේන්තුව විසින් 2024 පෙබරවාරි 06 දින සිට 2024 සැප්තැම්බර් 24 දින දක්වා කාලය තුලදී නිකුත් කර තිබූ මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර.බී. 04) හා ඒ පිළිබඳ අභ්‍යන්තර පාලනය ක්‍රියාත්මක වී ඇති ආකාරය සම්බන්ධයෙන් සිදුකල නියදි විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008.04.01 දිනැති අංක 1544/17 දරණ ගැසට් නිවේදනයේ සඳහන් රීති අනුව සුරාබදු ආඥා පනත ප්‍රකාර කවර හෝ වර්ගයක බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන සියළු තැනැත්තන් විසින් මේ රීතිවල 11 වන උප ලේඛණයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම් පත්‍රයෙහි සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතුය.

(ආ) සුරාබදු බලපත්‍ර ලබා ගැනීම සඳහා උනන්දුවක් දක්වන් සියලු පාර්ශවයන් වෙත සාධාරණ අවස්ථාවක් ලැබෙන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අභිලාශයන් කැඳවීමකින් තොරව අදාල සුරාබදු බලපත්‍ර නිකුත් කර තිබුණි.

(ඇ) සුරාබදු බලපත්‍ර ලබාදීමේදී එම බලපත්‍රය ලබාදුන් පුද්ගලයා/ආයතනය නිවැරදිව හඳුනාගත හැකිවන ආකාරයට විධිමත් ලේඛණයක් නඩත්තු කර නොතිබුණු අතර එක් එක් දිස්ත්‍රික් පදනමින් තොරතුරු එක් රැස්කර තිබුණත්, සියළුම තොරතුරු ඇතුළත් කර ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. එමඟින් සුරාබදු බලපත්‍ර එකම පුද්ගලයෙකු හෝ ආයතනයක් වෙත කුමන ප්‍රමාණයක් නිකුත් කලේද යන්න ඍජුවම තහවුරු කරගත නොහැකි විය. එම හේතුවෙන් එකම පුද්ගලයන් / ආයතන වෙත බලපත්‍ර අනුමත ප්‍රමාණය ඉක්මවා ලබාදීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) සුරාබදු දෙපාර්තමේන්තුව තුල බලපත්‍ර නිකුත් කිරීම සඳහා "LARAS" නැමති පරිගණක මෘදුකාංගය භාවිතයේ පැවතුණද, එම පරිගණක මෘදුකාංගය ආයතනික අවශ්‍යතාවයට ගැලපෙන ලෙස වැඩිදියුණු කර භාවිතයට ගැනීම සඳහා විගණිත දිනය වන 2024 නොවැම්බර් 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි. තවද එම හේතුවෙන් පද්ධතිය මඟින් විධිමත්, යාවත්කාලීන තොරතුරු ලබාගැනීමට නොහැකි වී තිබුණු බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඉ) මත්පැන් නිෂ්පාදනය 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය සලකා බැලීමේදී සමස්ථ මත්පැන් නිෂ්පාදනය ලීටර් 8,186,417 කින් හෙවත් සියයට 19 කින් අඩුවී ඇති පසුබිමක විශාල පිරිවැයක් දරා මත්පැන් බලපත්‍ර ලබාගැනීම තුලින් වෙළඳ පොළෙහි යම් විකෘති තත්ත්වයක් පිළිඹිඹු වේ. මෙම තත්ත්වය සලකා බැලීමේදී හා මෙම ආකාරයට නිකුත් කල බලපත්‍ර නීති විරෝධී මත්පැන් නිෂ්පාදන අලෙවි කිරීමට යොදා ගැනීම පිළිබඳව අවධානයට යොමුකලයුතු කරුණක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඊ) 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනතේ 31 වගන්තියට අනුව වයස අවුරුදු 21 අඩු තැනැත්තන් සඳහා දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන කිසිවක් අලෙවි කිරීම, අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒවා අලෙවි කිරීම සඳහා ඉඩ දීම හෝ ප්‍රවර්ධනය කිරීම නොකළ යුතු ය. එසේ වුවත් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් වයස අවුරුදු 21 ට අඩු තැනැත්තන් සඳහා හා වයස 21 අඩු තැනැත්තන් අධ්‍යක්ෂක ධුරයන් දරන පෞද්ගලික සමාගම් වෙත ද සුරාබදු අලෙවි බලපත්‍ර නිකුත් කර තිබුණි. මෙසේ අවුරුදු 21 ට අඩු තැනැත්තන්ට සුරාබදු අලෙවි බලපත්‍ර නිකුත් කිරීමේදී විශේෂත්වයක් දැක්වීමට තුඩු දුන් කාරණා විගණනයේදී විමසුම් සහගත විය.

(උ) 2024 ජනවාරි 12 දිනැති අංක 2366/39 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක 02/2024 දරණ සුරාබදු නිවේදනයේ VI උපලේඛණයේ (1) v වගන්තිය ප්‍රකාරව සුරාබදු බලපත්‍ර ලබාදීමේදී අලෙවි ඒකාධිකාරයක් ඇති නොවන ආකාරයට සුරාබදු බලපත්‍ර ලබාදිය යුතු බව දක්වා තිබුණද, එකම පුද්ගලයින් විසින් සමාගම් ලියාපදිංචිකර සුරාබදු බලපත්‍ර වැඩි ප්‍රමාණයක් ලබාගෙන තිබුණු අතර, ඒ තුලින් වෙළඳ ඒකාධිකාරී තත්වයක් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය.

(ඌ) සුරාබදු බලපත්‍ර ලබාගත් පුද්ගලයින් විසින් අදාල බලපත්‍ර ලබාගෙන ඉතා කෙටි කාලයක් තුල වෙනත් පාර්ශවයක් වෙත අලෙවිකර තිබූ අතර, ඒ අනුව එකී පුද්ගලයින් එම සුරාබදු බලපත්‍ර ලබාගෙන තිබුණේ සැබෑ ව්‍යාපාරික උවමනාවෙන් නොවන බව නිරීක්ෂණය විය.

(එ) ඇතැම් අවස්ථාවලදී සුරාබදු බලපත්‍රය ලබාගත් ආයතනය හෝ පුද්ගලයන් විසින් වෙනත් පුද්ගලයකු වෙත නීත්‍යානුකූල පැවරීමකින් තොරව එම බලපත්‍රය වෙනත් පුද්ගලයකු විසින් භාවිතාකරන බව නිරීක්ෂණය විය. මෙම හේතුවෙන් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින් සුරාබදු බලපත්‍ර ලබාගෙන ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන අවස්ථා පැවතුනි.

(ඒ) සුරාබදු බලපත්‍ර ලබාදීමේදී අදාල ස්ථානය සම්බන්ධයෙන් වන විරෝධතා දැකිවීම සඳහා ලබාදිය යුතු කාලය අවසන් වීමට ප්‍රථම ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් විරෝධතා නොමැති බවට නිර්දේශ කර ලිපි ඉදිරිපත් කර තිබුණි.

(ඔ) සුරාබදු බලපත්‍ර ලබාදීමේදී අදාල ස්ථානය සම්බන්ධයෙන් වන විරෝධතා සම්බන්ධයෙන් නිසි විමර්ෂණයක් සිදුකර ඒ සම්බන්ධව වාර්තා කලයුතු වුවත් එක් ආයතනයක් සම්බන්ධයෙන් එසේ නිසි කරුණු අධ්‍යනයකින් තොරව ප්‍රාදේශීය ලේකම්වරයා තම වාර්තාව ලබාදී තිබුණි.

(ෙ) මෙම කාල සීමාව තුල ලබාදුන් බොහෝ සුරාබදු බලපත්‍ර ලබාදී තිබුණේ පුද්ගලික සමාගම් නමින් වන අතර එම සමාගම් අදාල සුරාබදු බලපත්‍රය ලබා ගැනීම සඳහාම සංස්ථාපනය කරන ලද සමාගම් බව නිරීක්ෂණය විය. එසේම ඇතැම් සමාගම් සංස්ථාපනය කිරීමටත් පෙර සුරාබදු දෙපාර්තමේන්තුව විසින් එම සමාගම් නමින් සුරාබදු බලපත්‍ර ලබාදීම සඳහා වූ අයදුම්පත්‍ර ලබා දී තිබුණි.

6. කාර්මික අපරාධ ග්‍රහන හා අපරාධ ග්‍රහන පරීක්ෂාව

සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුල සිදුකල කාර්මික අපරාධ ග්‍රහන හා අපරාධ ග්‍රහන සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තුවකට 9,750 බැගින් අපරාධ ග්‍රහන ඉලක්ක 39,000 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු අතර නීති ක්‍රියාත්මක කිරීමේ අංශය මඟින් විගණනය වෙත ඉදිරිපත් කල තොරතුරු අනුව 2024 වර්ෂය සඳහා අපරාධ ග්‍රහන ඉලක්කය 41,737 ක් වී තිබුණු අතර වර්ෂය තුල සිදුකල සත්‍ය වැටලීම් ගණන 37,555 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා අපරාධ ග්‍රහන ඉලක්ක 39,000 ක් සහ කාර්මික අපරාධ ග්‍රහන 4,500 ක් වශයෙන් මුළු ග්‍රහන 43,500 ක් සැලසුම් කර වර්ෂය තුල අපරාධ ග්‍රහන 37,555 ක් හා කාර්මික අපරාධ ග්‍රහන 5,182 ක් වශයෙන් මුළු ග්‍රහන 42,737 ක් 2024 වර්ෂය සඳහා සිදු කර තිබුණි. සුරාබදු දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය රාජකාරියක් වන නීති ක්‍රියාත්මක කිරීමේ කාර්යය දර්ශකයන් ලෙස යොදා ගන්නා කාර්මික අපරාධ සහ අපරාධ ග්‍රහන සංඛ්‍යාව හැකිතාක් 50,000 ක සීමාවට ආසන්නව තබාගැනීමේ අවශ්‍යතාවය මුදල් අමාත්‍යාංශය විසින් අවධාරණය කර තිබුණි.

(ඇ) අපරාධ ග්‍රහන ඉලක්ක සපුරාලීම පිළිබඳ ප්‍රගතිය පරීක්ෂාවේදී 2024 වර්ෂයට දී තිබුණු ඉලක්කයට සාපේක්ෂව සිදුකර තිබූ ග්‍රහන සංඛ්‍යාව 1,445 කින් හෙවත් සියයට 4 කින් පමණ අඩු වී තිබුණි. එහිදී සුරාබදු ස්ථාන 28 ක නියමිත ඉලක්කයන් සපුරා නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ඉන් සුරාබදු ස්ථාන 02 ක සියයට 40 කට අඩු ප්‍රතිශතයකින් ද සුරාබදු ස්ථාන 14 ක් සියයට 90 කට අඩු ප්‍රතිශතයකින් ද සුරාබදු ස්ථාන 12 ක් සියයට 90 ත් සියයට 100 ත් අතර ප්‍රතිශතයකින් ද ඉලක්කයන් සපුරා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත හා 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ දුම්කොළ නිෂ්පාදනාගාර අධීක්ෂණය හා පාලනය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් සේ සලකා තිබුණද, සමාලෝචිත වර්ෂය තුල එම පනත් යටතේ සිදුකල අපරාධ ග්‍රහන මුළු අපරාධ ග්‍රහන වලින් පිළිවෙලින් සියයට 5 ක් හා සියයට 1 ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයක් විය.

7. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2024 දෙසැම්බර් 31 දින වන විට සුරාබදු දෙපාර්තමේන්තුවට අදාල අනුමත කාර්ය මණ්ඩලය 1,649 ක් වූ අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1,142 ක් විය. මේ අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 507 ක් පැවතුණි.

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

ඊ. එම්. කේ. එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල.

(4)

ඇමුණුම 2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PUR/E/EXD/RF/ 2024/FA/02

මගේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 22 දින

27 MAY 2025
සුරාබදු කොමසාරිස් ජනරාල් කාර්යාලය

සුරාබදු කොමසාරිස් ජනරාල්

සුරාබදු දෙපාර්තමේන්තුව

සුරාබදු තෑගි අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව සහ සහතික කරන ලද 2024 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

AC/12

ජී.ඒ්.ඩී. ධර්මපාල

විගණකාධිපති (වැ.බ)

පිටපත :- ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

ඩබ්ලිව්. උදය කුමාර පෙරේරා
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PUR/E/EXD/RF/ 2024/FA/02 ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 22 දින

සුරාබදු කොමසාරිස් ජනරාල්
සුරාබදු දෙපාර්තමේන්තුව

සුරාබදු තෑගි අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සුරාබදු තෑගි අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි මස 20 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සුරාබදු තෑගි අරමුදලේ 2024 වර්ෂය සඳහා පිළියෙල කල මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් 2.1 යටතේ එකී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කරන බවත්, ගිණුම් සටහන් 7 යටතේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම "උපචිත පදනම" මත සිදුකරන බවත් දක්වා තිබුණ නමුත් සුරාබදු තෑගි අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත පිළියෙල කර තිබුණි. ඒ අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ අයභාරය යටතේ සමාලෝචිත වර්ෂයට අදාල සමථ ගාස්තුව වන රු. 87,866,396 ක් හා වියදම් යටතේ ත්‍යාග මුදල් ගෙවීම් ලෙස රු. 55,874,888 ක් හදුනාගෙන ගිණුම්ගත කලයුතු වුවත් වර්ෂය තුල මුදලින් ලද සමථ ගාස්තුව වූ රු. 159,642,538 ක් හා මුදලින් ගෙවූ ත්‍යාග වටිනාකම වන රු. 36,860,836 ක් සමථ ගාස්තු ලැබීම් හා ත්‍යාග ගෙවීම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සුරාබදු තෑගි අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල ලැබිය යුතු සමථ ගාස්තු ශේෂයක් දක්වා නොතිබුණි. එසේම එක් එක් වර්ෂයට අදාලව නියම කල සමථ ගාස්තුවෙන් මුදලින් ලද ප්‍රමාණය හා තව දුරටත් ලැබිය යුතු සමථ ගාස්තුව නිවැරදිව හදුනාගැනීම සඳහා වූ කාර්යක්ෂම ක්‍රමවේදයක් සුරාබදු දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොමැති 2024 වර්ෂය තුල හෝ ඊට පෙර වර්ෂවල අයකරගන්නා ලද සමථ ගාස්තු වලට අදාලව හදුනාගත් ගෙවිය යුතු ත්‍යාග මුදල් වටිනාකම රු. 26,873,465 ක් වූ අතර එම වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුල ගෙවිය යුතු ත්‍යාග වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07 හි 86 ඡේදය පරිදි දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වත්කම් උපලේඛනය තුල එම වත්කම්වල ධාරණ අගය (පිරිවැය), සමුච්චිත ක්ෂය හා ශුද්ධ ධාරණ අගය හෙළිදරව් කළ යුතු වුවද රු. 96,364,434 ක් වූ දේපළ පිරියත හා උපකරණවල ශුද්ධ ධාරණ අගය පමණක් හෙළිදරව් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම දේපළ පිරියත හා උපකරණවල දළ ධාරණ අගය රු. 202,144,484 ක් විය.

(ඉ) සුරාබදු තෑගි අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල දක්වා තිබූ වත්කම් කාණ්ඩ තුනකට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසාන වත්කම් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල රු. 780,167 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර වර්ෂයේ ක්ෂය වියදම රු. 260,091 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. එසේම 2024 වර්ෂය සඳහා ක්ෂය සංචිත අරමුදල වෙත රු. 260,091 ක් වැඩියෙන් ප්‍රේෂණය කර තිබුණි.

(ඊ) 2023 වසරේදී අපහරණය කර තිබූ පිරිවැය රු. 109,659 ක වත්කම් සමාලෝචිත වසරේදී ද වත්කම් උපලේඛනයෙන් ඉවත් කර නොතිබූ අතර ඒ මත රු. 1,394 ක් ක්ෂය කර තිබුණි.

(උ) කාර්මික අපරාධ වාර්තා වෙනුවෙන් සමථ ගාස්තු අයකර ගැනීම සඳහා 2001 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා තැන්පත් කර තිබූ රු. 19,749,450 ක් වූ ඇප තැන්පතු ශේෂය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ 1.2 හි (ඇ), (ඉ) සහ 3.1 හි (අ) ඡේදයන් හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2 මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති රීති රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 17 (අ), (ආ) i හා ii ඡේද	දුම්කොළ බදු පනත යටතේ ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක ප්‍රමාණයක් යොදාගනිමින් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් දුම්කොළ අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යා යුතු වුවත්, 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත ක්‍රියාත්මක වූ දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණු අතර මේ දක්වා වාර්ෂිකව දුම්කොළ අරමුදලට වෙන්කල මුදල් භාවිතා කිරීමකින් තොරව දුම්කොළ අරමුදලට ගෙවිය යුතු මුදල් ලෙස සුරාබදු තැගි අරමුදලේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිගු කාලීන බැරකම් යටතේ දක්වා තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට දුම්කොළ අරමුදලට ගෙවිය යුතු මුදල් ගිණුමේ ශේෂය රු. 25,427,350 ක් විය.
(ආ) අංක 818 දරන සුරාබදු නිවේදනයේ 05 සහ 07 ඡේද	අංක 818 දරන සුරාබදු නිවේදනයේ 05.3 මඟින් අරමුදල වෙත ලැබෙන මුදලින් සියයට 75 ක් සුරාබදු නිලධාරීන්, තොරතුරු සපයන්නන් සහ අදාළ අනික් අය අතර බෙදා දීම සඳහා ප්‍රයෝජනයට ගතයුතු බව දක්වා ඇති අතර එම සියයට 75 ක මුදලින් නිවේදනයේ 07.1(ඇ) අනුව නඩුව මෙහෙයවන නිලධාරියා වෙත හිමි සියයට 5 ක ත්‍යාග මුදල සහ 07.1(ඉ) අනුව ග්‍රහණ වැඩ පරීක්ෂා කරන හෝ කාර්මික අපරාධ වාර්තාවලට කෙළින්ම සම්බන්ධ කාර්යාල වැඩට සහාය වන, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්, ගණක ලිපිකරු සහ සමාන්තර සේවාවන්වල නිලධාරීන් වෙත ගෙවිය යුතු සියයට 35 ක ත්‍යාග මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

3.2.1 ශුද්ධ වත්කම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක සුරාබදු තැගි අරමුදලේ ශුද්ධ වත්කම් සැසඳීමේ දී 2020 සහ 2021 වර්ෂවල අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් එම වර්ෂ වල ශුද්ධ වත්කම් ද ක්‍රමයෙන් සැලකිය යුතු පිරිහීමක් නිරීක්ෂණය විය. 2022 වර්ෂයේ ශුද්ධ වත්කම් ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයේ දි එම වර්ධන ප්‍රතිශතය සියයට 12 ක් වූ අතර සමාලෝචිත වර්ෂ තුලදී සියයට 26 ක් වී තිබුණි. මෙලෙස අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම කෙරෙහි ත්‍යාග ගෙවීම්වල පෙර වර්ෂයට සාපේක්ෂව සිදුවූ සියයට 62 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2.2 අරමුදලේ තැන්පත් ගිණුම

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක භාණ්ඩාගාරයේ පැවති අරමුදලේ තැන්පත් ගිණුමේ ශේෂ සැසඳීමේ දී 2021 වර්ෂයේ පිරිහීමක් පෙන්නුම් කලත් 2022 වර්ෂයේ සිට එහි සැලකිය යුතු වර්ධනයක් සිදුවී තිබුණි. ඉකුත් වර්ෂයේ එම වර්ධන ප්‍රතිශතය සියයට 19 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 36 ක් වී තිබුණි.

3.2.3 ආදායම් අයවීමේ ප්‍රගතිය

(අ) 2024 වර්ෂය තුල අරමුදල විසින් අයකරගත් සමස්ථ ආදායම රු.163,896,938 ක් වූ අතර ඉන් සියයට 97 ක් සමථ ගාස්තු ආදායම් නියෝජනය විය.

(ආ) පසුගිය වර්ෂය තුල කාර්මික අපරාධ සම්බන්ධ සමථ ගාස්තු පැනවීම් රු. 145,361,398 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය තුලදී රු. 87,866,396 ක් වී තිබුණි. ඒ අනුව කාර්මික අපරාධ ග්‍රහණ මත සමථ ගාස්තු පැනවීම පෙර වර්ෂයට සාපේක්ෂව රු. 57,495,002 කින් හෙවත් සියයට 40 කින් පමණ අඩුවී තිබුණි.

3.2.4 තැගි අරමුදල් ගෙවීම්

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ත්‍යාග දීමනා සඳහා රු. 123,750,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර වර්ෂය තුල ත්‍යාග දීමනා ලෙස රු. 36,860,836 ක් ගෙවා තිබුණි. එය ඇස්තමේන්තුගත ත්‍යාග දීමනාවලින් සියයට 30 ක ප්‍රතිශතයක් විය.

3.3 කාර්යසාධනය

3.3.1 කාර්මික අපරාධ ග්‍රහණයන් පරීක්ෂාව

(අ) 2023 වර්ෂය තුල කාර්මික අපරාධ ග්‍රහන 5,499 ක් සිදුකර තිබුණු අතර ඒ සඳහා නියම කල සමථ ගාස්තුව රු. 145,361,400 ක් විය. සමාලෝචිත වර්ෂය තුල කාර්මික අපරාධ ග්‍රහන 5,182 ක් සිදුකර තිබුණු අතර ඒ සඳහා නියම කල සමථ ගාස්තුව රු. 87,866,396 ක් විය. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල කාර්මික අපරාධ ග්‍රහන 317 කින් හෙවත් සියයට 6 කින් අඩුවී තිබුනු අතර නියම කල සමථ ගාස්තුව රු. 57,495,004 කින් හෙවත් සියයට 40 කින් අඩුවී තිබුණි.

(ආ) කාර්මික අපරාධ ඉලක්ක සපුරාලීම පිළිබඳ ප්‍රගතිය පරීක්ෂාවේදී බොහොමයක් සුරාබදු ස්ථාන 2024 වර්ෂයට දී තිබුණු ඉලක්කයන් ඉක්මවා ග්‍රහනයන් සිදුකර තිබුණු අතර සුරාබදු ස්ථාන 12 ක ඉලක්ක සැපිරීමේ ප්‍රගතිය ඉලක්ක කල ග්‍රහනයන්ට වඩා අඩු අගයක විය. ඉන් ස්ථාන 03 ක ප්‍රගතිය සියයට 25 ත් සියයට 75 ත් අතර විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල කාර්මික අපරාධ ග්‍රහන ඉලක්ක පරීක්ෂාවේ දී මත්පැන් ආශ්‍රිත ක්‍රියාකාරකම් බහුල ප්‍රදේශ වලට අයත් සුරාබදු ස්ථාන 10 ක වාර්ෂික ඉලක්ක ඉක්මවා තිබුණ ද එම ස්ථාන වලට ලබා දී තිබු ඉලක්ක සහ සත්‍ය ග්‍රහන පහල අගයක පැවති බව නිරීක්ෂණය විය.

3.4 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (3) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුල සුරාබදු ත්‍යාග අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයන් සිදුකර නොතිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පරිච්ඡේදය - 04

කාර්යසාධන දර්ශක

4.1 හැඳින්වීම

4.2 ආයතනයේ කාර්යසාධන දර්ශක

- **4.2.1** පාලන අංශය
- **4.2.2** ආදායම් අංශය
- **4.2.3** නීති ක්‍රියාත්මක කිරීම් අංශය
- **4.2.4** ගිණුම් අංශය
- **4.2.5** අභ්‍යන්තර විගණන අංශය
- **4.2.6** මානව සම්පත් අංශය
- **4.2.7** තොරතුරු තාක්ෂණ අංශය
- **4.2.8** ප්‍රවාහන හා යෙදවුම් අංශය
- **4.2.9** අධ්‍යයන හා පර්යේෂණ අංශය
- **4.2.10** සංඛ්‍යාලේඛන අංශය
- **4.2.11** සැපයුම්දාම නියාමන අංශය
- **4.2.12** නීති අංශය
- **4.2.13** සමාජ ආරක්ෂණ අංශය

4.1 හැඳින්වීම

2024 වර්ෂයට අදාළව මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනයේ කාර්යසාධන දර්ශක එක් එක් අංශයට අදාලව සකස් කර ඇත. 2024 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට ලබාදුන් ආදායම් ඉලක්කය රුපියල් බිලියන 232 ක් විය. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 214.58 ක් ආදායම ලෙස මහා භාණ්ඩාගාරයට ලබා දී ඇති අතර රුපියල් බිලියන 12.2 ක බදු අවකරණය ද සහිතව එකතු කරන ලද ආදායම රුපියල් බිලියන 226.7 ක් විය. ඒ අනුව ආදායම එකතු කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස ගත් කල 98% ක ප්‍රතිශතයක් වාර්තා කර ඇත. 2024 වර්ෂයේදී රට මුහුණ දුන් විවිධ අර්බුදයන් මධ්‍යයේ වුවද දෙපාර්තමේන්තු ඉතිහාසයේ වසර 112 කට පසුව ඉහළම ආදායම වූ රුපියල් බිලියන 214.58 ක් මහා භාණ්ඩාගාරයට බැර කිරීමට හැකිවීම ද සතුටට කරුණකි.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනය සඳහා දායක වූ දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් පිළිබඳව සලකා බැලීමේදී අභ්‍යන්තර විගණන අංශය, සමාජ ආරක්ෂණ අංශයේ මත්පැන් හා මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීම හා සමාජ සුභසාධන කටයුතු හා නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ සුරාබදු බලපත්‍ර සඳහා කාර්මික අපරාධ වාර්තාවල ප්‍රගතිය 100 % ඉක්මවූ ප්‍රතිශතයක් ලබා තිබෙන අතර ගිණුම් අංශය, නීති අංශය, මානව සම්පත් අංශය, තොරතුරු හා තාක්ෂණ අංශයේ ASYCUDAපද්ධතිය හරහා මාර්ගගත ක්‍රමයට පහසුකම් ලබා දීම සහ සමාජ ආරක්ෂණ අංශයේ ප්‍රමිතිගත මත්පැන් ලබාදීම තුළින් සෞඛ්‍ය උපද්‍රවයන්ගෙන් ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම යන කටයුතු 100%ක ප්‍රගතියක් අත්කර ගෙන ඇති බව සතුටින් සඳහන් කල හැකිය. එමෙන්ම තවත් අංශ 7 ක් ඔවුන්ගේ කටයුතුවල ප්‍රගතිය 90 % - 100 % අතර සීමාවේ පවත්වා ගෙන තිබීමද අගය කළ යුත්තකි.

පාලන අංශය 95%ක ප්‍රගතියක් පෙන්වා ඇති අතර 2024 වර්ෂය තුළ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 08 ක් සඳහා ජ්‍යෙෂ්ඨත්වය අනුව සුරාබදු අධිකාරීවරුන් 06 දෙනෙකු සඳහා කාර්යයන් පැවරීම සිදු කර ඇත. සුරාබදු අධිකාරීවරුන් 11 දෙනෙකු සහකාර සුරාබදු කොමසාරිස් තනතුරෙහි රාජකාරී ඉටුකිරීම / ආවරණය / වැඩබැලීම කිරීම සිදු කරන ලදී. සුරාබදු අධිකාරී තනතුරු 31 සඳහා ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරුන් විසින් රාජකාරී ආවරණය කරන ලදී. සුරාබදු අධිකාරී තනතුරු 08ක් සහ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 13 ක් සඳහා නිලධාරීන් උසස්කිරීමට අයදුම්පත් කැඳවා ඇත. සුරාබදු අධිකාරී තනතුරු 08ක් සහ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 13 ක් සඳහා නිලධාරීන් උසස්කිරීමට සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි අධිසේවක පදනම මත 67 දෙනෙකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත. සුරාබදු පරීක්ෂක තනතුරු 22ක් සඳහා සීමිත පදනම මත ද, සුරාබදු පරීක්ෂක තනතුරු 34ක් සහ සුරාබදු නියාමක තනතුරු 100ක් සඳහා විවෘත පදනම මත ද බඳවා ගැනීමට තරඟ විභාගය පවත්වා ඇති අතර එහි ප්‍රතිඵල නිකුත් කර ඇත.

90% ත්-100% ත් අතර ප්‍රගතියක් පෙන්වන අනෙකුත් අංශයන් පිළිබඳව සලකා බලන විට ආදායම් අංශයේ මත්පැන් බදු රැස්කිරීම, නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ අදාල අණපණත් ක්‍රියාත්මක කිරීම හා වැටලීම් සිදුකිරීම, තොරතුරු තාක්ෂණ අංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, ප්‍රවාහන හා යෙදවුම් අංශයේ ප්‍රවාහන කටයුතු, අධ්‍යයන හා පර්යේෂණ අංශය, සංඛ්‍යාලේඛන අංශය, සැපයුම් දාම නියාමන අංශය තම කාර්යය සාධනය 100% මට්ටමට ආසන්නව සිදු කරන ලදී.

ආදායම් අංශයේ දුම්කොළ බදු ආදායම රැස් කිරීම සම්බන්ධ කටයුතු වල ප්‍රගතිය 50% - 74% මට්ටමේ තබා ගැනීමට සමත් වී ඇත. අධ්‍යයන හා පර්යේෂණ අංශය මගින් මහ රා ප්‍රමිතිකරණය කිරීම සඳහා අවශ්‍ය මූලික පර්යේෂණ කටයුතු 2022 වර්ෂයේ ආරම්භ කල අතර 2024 වර්ෂයේදී එම කටයුතු අවසන් අදියර දක්වා සාර්ථකව සිදු කරන ලදී. ඒ අනුව පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය 90% ක පමණ මට්ටමකට ළඟා කර ගැනීමට සමත් වී ඇත. නියමිත ප්‍රමිතියෙන් යුතු මත්පැන්, පරිභෝජනය කරන්නන් වෙත ලැබේ දැයි පරීක්ෂා කිරීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදුකරන රසායනාගාරයක් පිහිටුවීමට ප්‍රතිපාදන 2023 වර්ෂයේ අයවැය යෝජනා මගින් වෙන්කර ඇති අතර 2024 වර්ෂයේදී එම කටයුතු 90% ක පමණ ප්‍රමාණයක් අවසන් කිරීමට හැකි වූ අතර 2025 වර්ෂයේදී එම රසායනාගාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.කෙසේ වුවද ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 10 ක ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස 90% ට වඩා ඉහළ අගයක් ගැනීම විශේෂත්වයකි. මේ අනුව සලකා බලන කළ ශ්‍රී ලංකා සුරාබදු

ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 10 ක ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස 90% ට වඩා ඉහළ අගයක් ගැනීම විශේෂත්වයකි. මේ අනුව සලකා බලන කළ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යසාධනයේ තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සාර්ථකව ඉහළ ප්‍රගතියක් පෙන්වා ඇත.

4.2 ආයතනයේ කාර්යසාධන දර්ශක (2024 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී අංශ	විශේෂිත දර්ශක		තත්‍ය නිමැවුම, අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස				
			>100%	90 %- 100%	75%- 89 %	50 %- 74 %	0% - 50%
4.2.1 පාලන අංශය	පාලන හා පරිපාලන කටයුතු			95%			
4.2.2 ආදායම් අංශය	2024 අපේක්ෂිත ආදායම රැස් කිරීම	මත්පැන් බදු		98%			
		දුම්කොළ බදු				60%	
4.2.3 නීති ක්‍රියාත්මක කිරීම් අංශය	1. අදාළ අණපනත් ක්‍රියාත්මක කිරීම, මත්ද්‍රව්‍ය අපරාධ වාර්තා සහ දුම්කොළ ආශ්‍රිත වැටලීම්.			96.2%			
	2. සුරාබදු බලපත්‍ර සඳහා කාර්මික අපරාධ වාර්තා.		115%				
4.2.4 ගිණුම් අංශය	2024 වර්ෂයේ සියලුම ගිණුම් කටයුතු			100%			
4.2.5 අභ්‍යන්තර විගණන අංශය	2024 වර්ෂයේ ඉටුකල යුතු අභ්‍යන්තර විගණන වැඩ සටහන		110%				
4.2.6 මානව සම්පත් අංශය	සමස්ත නිලධාරි පුහුණුව හා නිලධාරී සංවර්ධනය			100%			
4.2.7 තොරතුරු හා තාක්ෂණ අංශය	වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම			90%			
	නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	1. RAMIS පද්ධතියට අතුරු මුහුණත හරහා දත්ත ලබා දීම.					45%
		2. ASYCUDAපද්ධතිය හරහා මාර්ගගත ක්‍රමයට පහසුකම් ලබා දීම		100%			
		3. RASED පද්ධතිය සකස් කිරීම					45%
		4. Sticker ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සම්බන්ධීකරනය කිරීම හා ඒ සඳහා ගිවිසුම් ගත වීම			80%		
4.2.8 ප්‍රවාහන හා යෙදවුම් අංශය	යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු හා ප්‍රවාහන හා සෙසු අදාළ රාජකාරී			90%			
4.2.9 අධ්‍යයන හා පර්යේෂණ අංශය	අධ්‍යයන කටයුතු			95%			
	පර්යේෂණ කටයුතු			90%			
4.2.10 සංඛ්‍යාලේඛන අංශය	සංඛ්‍යාලේඛන කටයුතු හා දත්ත නිකුත් කිරීම			95%			
4.2.11 සැපයුම්දාම නියාමන අංශය	ස්ටිකර් ව්‍යාපෘතිය	දේශීය		95%			
		විදේශීය		95%			
4.2.12 නීති අංශය	නීතිමය අවශ්‍යතා හා අපේක්ෂිත නව ප්‍රවණතා			100%			
4.2.13 සමාජ ආරක්ෂණ අංශය	මත්පැන් හා මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීම හා සමාජ සුභසාධන කටයුතු		150%				
	ප්‍රමිතිගත මත්පැන් ලබාදීම තුළින් සෞඛ්‍ය උපද්‍රවයන්ගෙන් ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම			100%			

පරිච්ඡේදය - 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) හඳුනා ගැනීමේ කාර්ය සාධනය

5.1 හැඳින්වීම

5.2 තිරසාර සංවර්ධනය ඉලක්ක මත පදනම් වූ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් හා ප්‍රගතිය

5.1 හැඳින්වීම

තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධනය පිළිබඳ පනතේ විධිවිධාන පරිදි ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද තිරසාර සංවර්ධනය පිළිබඳ කවුන්සිලයේ මග පෙන්වීම මත සෑම රාජ්‍ය ආයතනයක්ම, අධ්‍යාපන ආයතනයක්ම හා සිවිල් සමාජයක්ම 2030 වර්ෂයේදී ඉටුකර ගත යුතු තිරසාර සංවර්ධනය අරමුණු කොට ගෙන තිරසාර සංවර්ධන අරමුණු 17 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු වැඩ පිළිවෙලකි. ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා රාජ්‍ය ආදායම් එකතු කරනු ලබන ප්‍රධාන හා වගකිව යුතු ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව තිරසාර සංවර්ධන අරමුණු 17 න් ප්‍රධාන වශයෙන් අරමුණු 05 ක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරයි. එකී අරමුණු වන්නේ , අරමුණු අංක 01, 03, 12, 16 සහ 17 වේ. මේ පිළිබඳව විස්තරාත්මකව පරිච්ඡේද අංක 5.2 හි කරුණු දක්වා ඇත.

ඉහත සඳහන් අරමුණු අතුරින් අරමුණු අංක 1 එනම්, විශේෂිත වූ සෑම තැනම සෑම ආකාරයකින්ම පවතින දිළිඳුභාවය තුරන්කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා 2024 වර්ෂයේදී අප විසින් රුපියල් බිලියන 226.7 ක් ආදායම් ලෙස එකතු කරන ලද අතර, එය ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාවගේ සංවර්ධනය උදෙසා සහ ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා භාවිත කිරීමට මහා භාණ්ඩාගාරයට බැර කර ඇත. දිළිඳු භාවය දුරු කිරීම සඳහා ප්‍රධාන සාධකයන් වන ආර්ථික සංවර්ධනයට සෘජුව බලපාන නීති විරෝධී මද්‍යසාර හා මත්පැන් සමාජයෙන් ඉවත් කිරීම ඉතා වැදගත් වේ. මෙම කාර්යයෙහිලා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විශිෂ්ට දායකත්වයක් ලබා දෙනු ලැබේ. දුම්කොළ භාවිතය ද මිනිස් ශරීරයට හිතකර වන්නක් නොවන බැවින් දුම්කොළ භාවිතය අධෛර්යමත් කිරීමේ අරමුණින් සහ රාජ්‍ය ආදායම ඉහල නංවා ගැනීම තුලින් ජනතාවට අවශ්‍ය සහන සලසා දීමේ අරමුණින් බීඩි සඳහා නව බදු ප්‍රතිපත්තියක් 2023.01.01 දින සිට හඳුන්වා දුන් අතර (1999 අංක 08 දරණ දුම්කොළ පනත) එමඟින් සියලුම බීඩි නිෂ්පාදකයින් ලියාපදිංචි කර බදු අය කර ගැනීමට කටයුතු ක්‍රියාත්මක කර ඇත. මත්පැන් හා දුම්කොළ සම්බන්ධයෙන් සිදුකරන නීති විරෝධී කටයුතුවලට වැටලීම් සිදු කිරීමෙන් පමණක් මත්පැන් හා දුම්කොළ භාවිතයට යොමුවීම වැළැක්වීමට නොහැකි අතර ඒ සඳහා ඇති ඉල්ලුම අඩු කිරීම ද විශේෂිත වේ. ඒ අනුව දැවැන්ත සමාජ දැනුවත් කිරීමේ ව්‍යාපාර හා ඊට අදාල අනිකුත් සමගාමී ආයතන සමඟ එක්ව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කරනු ලැබේ.

තිරසර සංවර්ධන අරමුණු අංක 3 එනම්, දරිද්‍රතාවයෙන් පෙලෙන හා අවධානමට ලක් වී තිබෙන ජනතාවගේ යහ පැවැත්ම හා සෞඛ්‍ය ආරක්ෂිත බව සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව කැපවීමෙන් කටයුතු කරනු ලැබේ. වාර්ෂිකව මත්පැන් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා බදු මුදල් වැඩි කිරීමෙන් ඒ සඳහා වන මිලදී ගැනීමේ හැකියාව අඩු කිරීමත් ඊට ඇති ඉල්ලුම අඩු කිරීමත් සිදු කරනු ලැබේ. ජනතාව අතර මත්පැන් ලබාගත හැකි සීමාවන් දැඩි කිරීමෙන්ද, නිකුත් කරනු ලබන නීත්‍යානුකූල මත්පැන් නිසි ප්‍රමිතියෙන් යුතුව නිෂ්පාදනය කිරීම ද, හැකිතාක් දුරට ජනතාවට මත්පැන්වලින් ඉවත්ව සිටීම සඳහා නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් ද, පරිසරයට සිදුවන හානි අවම කිරීමට අදාළ සමගාමී ආයතන සමඟ එක්ව ක්‍රියා කිරීම ද වැදගත් පියවරක් ලෙස පෙන්වා දිය හැක.

තිරසර සංවර්ධන අරමුණු අංක 12 එනම්, නිෂ්පාදන රටා සහ පරිභෝජන රටා සුරක්ෂිත කිරීම සඳහා මද්‍යසාර නිෂ්පාදනය කරනු ලබන සියලුම නිෂ්පාදකයින් එකී කටයුතු සිදු කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ නියෝගයන් හා නියමයන්ට අනුව කටයුතු කිරීමෙන් ස්වභාවික ජල මූලාශ්‍ර හා පිරිසිදු වාතාශ්‍රය ලබා දීම සඳහා බොයිලේරු ක්‍රියාත්මක කිරීමේදී සහ ජල පිරිසිදු කිරීම් සිදු කිරීමේදී අදාල පළාත් පාලන ආයතනවල නිර්දේශ හා උපදෙස් අනුව කටයුතු කිරීමට ද නිෂ්පාදකයින් දිරිමත් කරන ලදී. මීට අමතරව මත්පැන් පරිභෝජනය කිරීමෙන් පසු ඉවත දමන බෝතල් සහ කෑන් ආදිය තැන තැන දමා යාමෙන් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම සඳහා දිවයින පුරා විසිරී පවතින සේ මත්පැන් අලෙවිසල් අසල කූඩ සවි කිරීම සිදු කර ඇත.

තිරසර සංවර්ධන අරමුණු අංක 16 සහ අංක 17 යටතේ සියලුම දෙනාට නීතියේ සාධාරණත්වය ඇතිවන ආකාරයෙන් සහ අත්අඩංගුවට ගන්නා පුද්ගලයින්ට වද හිංසා කිරීම්, කුට්ඨනයට ලක් කිරීම් හා ප්‍රචණ්ඩත්වයට ලක්වීම වැළැක්වීම සඳහා සියලුම නිල ඇදුම් කාර්ය මණ්ඩලයට නිරන්තර උපදෙස් ලබා දීම සිදු කරනු ලැබේ. රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා ගනු ලබන සෑම ක්‍රියාමාර්ගයකදීම අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම සඳහා සිදු කරනු ලබන සියලුම රාජකාරී ඵලදායී, වගවීමෙන් යුතු සහ විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම සඳහා කටයුතු කර ඇත. මේ අනුව නිරන්තර නිලධාරී පුහුණුව, අල්ලස් හා දූෂණ වළක්වා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ද, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සමාජ හිංසනයෙන් තොරව රාජකාරී කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීමට ද, නිරන්තරයෙන් කටයුතු කරන ලදී. වර්ෂ 2030 වන විට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව තුළ තිරසාර සංවර්ධනයේ මූලික අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා කටයුතු කළ හැකි සෑම ආකාරයේ ක්‍රියාකාරකමක්ම නොපිරිහෙලා ඉටු කිරීම සඳහා කටයුතු කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය ඇප කැප වී කටයුතු කරනු ලැබේ.

5.2 තිරසාර සංවර්ධනය ඉලක්ක මත පදනම් වූ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් හා ප්‍රගතිය

- තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට එම අරමුණු ඇතුළත් කර සකස් කර ඇත.
- 2024 වර්ෂයේ ඉලක්ක ගත තිරසාර සංවර්ධන අරමුණු සහ ඒ සඳහා නිශ්චිත ක්‍රියාකාරකම් පහතින් දැක්වේ.

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% -70%	75%-100%
අරමුණ - 01 සෑම තැනම, සෑම ආකාරයකින්ම පවතින දිළිඳුභාවය තුරන් කිරීම.	➢ කාර්යක්ෂමව හා සඵලදායී ලෙස නියමිත බදු එකතු කිරීම තුලින් රටේ සංවර්ධනයට දායක්ත්වය ලබා දීම, ආර්ථික හා සමාජීය සංවර්ධනයට හා යටිතල පහසුකම් සංවර්ධනයට එම බදු මුදල් රාජ්‍ය භාණ්ඩාගාරයට නිසි කලට බැර කිරීම.				✓
	➢ නීති විරෝධී මත්පැන් සහ අන්තරායකර ඖෂධ මත කාර්යක්ෂමව හා ඵලදායී ලෙස නිතී ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ ආරක්ෂණය වැඩි දියුණු කිරීම හා දුප්පත්කම දුරු කිරීම.				✓
	➢ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින්ම ගම්මාන තෝරා ගෙන මත්පැන් හා අන්තරායකර ඖෂධ භාවිතය හා එහි ප්‍රතිවිපාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සමාජ සංවර්ධනය ඇති කිරීම.		✓		
	➢ මත්පැන් හා දුම්වැටි නිෂ්පාදන මිලදී ගැනීම අධෛර්යමත් කිරීම සඳහා වාර්ෂික බදු වැඩි කිරීම හෝ මිල වැඩි කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකය දියුණු කිරීම.				✓
	➢ බීඩි නිෂ්පාදනය සඳහා 2022.02.31 දිනැති 1999 අංක 08 දරණ පනත අනුව බීඩි දුම්කොළ බද්ද නමින් නව බද්දක් පනවන ලදී. එමගින් බීඩි මිලදිගැනීම අධෛර්යමත් කිරීම හා ලැබෙන ආදායම රාජ්‍ය ආදායමට බැර කිරීම තුලින් ජනතාවට සහන සැලසීම.				✓
	➢ මත්පැන් හා දුම්කොළ පරිභෝජනය හා එහි ආදීනව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මත්පැන් හා දුම්කොළ පරිභෝජනය අවම හෝ අඩු කිරීමට පියවර ගැනීම.			✓	

අරමුණ - 03 සියලු දෙනා සඳහා නිරෝගිමත් ජීවිතයක් සුරක්ෂිත කිරීම සහ සියලු වයස් කාණ්ඩයන්හි යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	➢ නීත්‍යානුකූල ලෙස නිපදවන මත්පැන්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා සම්බන්ධ වී සියලුම මත්පැන් සඳහා ප්‍රමිතීන් සකස් කිරීම සහ එම ප්‍රමිතීන් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කිරීම.				✓
	➢ සෞඛ්‍යය හා ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා නීති විරෝධී මත්පැන් හා දුම්කොළ නිෂ්පාදන ව්‍යාප්තිය අවම කිරීම හා පාලනය කිරීම.				✓
	➢ සඵලදායී නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ ආරක්ෂණය ඇති කිරීම.				✓
	➢ මහජන යහපැවැත්ම උදෙසා අන්තරායකාරී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම.				✓
	➢ වයස අවුරුදු 21 අඩු පිරිස සඳහා මත්පැන් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම පාලනය කිරීම.				✓
	➢ නීති විරෝධීව මහරා නිෂ්පාදනය කිරීම පාලනය කරනු වස් නිශ්චිත ප්‍රමිතීන් තල්,පොල්, කිතුල් සඳහා සකස් කිරීම.			✓	
	➢ මනුෂ්‍ය ජීවිත මත්පැන්වලට ඇබ්බැහි වීමේ අවධානමෙන් වළක්වා ගැනීම සඳහා සියලු මට්ටම්වල වෙසෙන ප්‍රජාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.				✓
	➢ මහජනතාවගේ සෞඛයට හිතකර වන ලෙස පරිසර දූෂණය වීම වැළැක්වීම සඳහා මත්පැන් භාවිතයෙන් පසු ඉවත දමන බෝතල් සහ කෑන් එකතු කර ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා මත්පැන් අලෙවිසැල් ආශ්‍රිතව කූඩ සවි කිරීම.				✓

අරමුණ - 12 තිරසාර නිෂ්පාදන රටා සහ පරිභෝජන රටා සුරක්ෂිත කිරීම.	➢ මත්පැන් හා දුම්කොළ පරිභෝජනය හා පාලනය කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ➢ නීතිවිරෝධී මත්පැන් පාලනය කිරීම සඳහා වාර්ෂිකව ඒකපුද්ගල මත්පැන් පරිභෝජනය ගණනය කිරීම සහ ඒ අනුව ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය පාලනය කිරීම. ➢ බදු පරිපාලනය පහසු කිරීමට සහ ආදේශක වෙළඳපොලට පැමිණීම පාලනය හා සෞඛ්‍යාරක්ෂාව සඳහා මත්පැන් සඳහා ආරක්ෂිත ස්ථිකරයක් හඳුන්වා දීම. ➢ ගුණාත්මකභාවයෙන් ඉහළ මත්පැන් හා දුම්කොළ සහතික කිරීම සඳහා මත්පැන් නිෂ්පාදනාගාර හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදනාගාර කාර්යක්ෂම හා ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම. ➢ සියලුම මත්පැන් නිෂ්පාදනාගාර සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර සුරක්ෂිතතාවය පිළිබඳ සහතික, බොයිලේරු සහතික හා ජල පිරිසිදු කිරීම් සහතික ලබා දීමට කටයුතු කිරීම.			✓ ✓ ✓	✓ ✓ ✓

අරමුණ - 16 තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ අන්තර්ග්‍රාහී සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම සහ සියලු මට්ටම්වලදී ඵලදායී, වගවීමෙන් යුතු සහ අන්තර්ග්‍රාහී ආයතන ගොඩනැගීම.	➢ අන්තරායකර ඖෂධ, නීති විරෝධී මත්පැන් හා දුම්කොළ නිෂ්පාදන පිළිබඳව ඵලදායී ලෙස නීතිය බලාත්මක කිරීම හරහා ප්‍රජාව සඳහා සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පියවර ගැනීම.				✓
	➢ සියලුම නිලධාරීන් නීතිගරුකව රාජකාරී කටයුතු කිරීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් හා පුහුණුව ලබා දීම.				✓
	➢ සියලුම කාර්ය මණ්ඩලය වගවීමෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය පරිසරය සැකසීම.				✓
	➢ නීති අංශයක් ක්‍රියාත්මක කිරීමෙන් නීත්‍යානුකූල පරිසරයක් තුළ රාජකාරී සිදු කිරීමට සුදුසු පරිසරයක් සැකසීම.				✓
	➢ සියලුම නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා අවම වශයෙන් එක් නිලධාරියෙකුට පැය 12 ක පමණ හෝ ආයතනිකව හෝ බාහිරව පුහුණුව ලබා දීම.			✓	
	➢ කාන්තා නිලධාරිනියන්ට උසස්වීම් සඳහා සමාන අවස්ථා ලබා දීම සහ ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයටම සාධාරණ වැටුපක් සඳහා අවස්ථා ලබා දීමෙන් ස්ත්‍රී පුරුෂ භාවය මත වෙන්කොට නොසැලකීම.			✓	
	➢ නීත්‍යානුකූලව නිෂ්පාදනය කරනු ලබන මත්පැන් හා දුම්කොළ කර්මාන්තයෙන් ලබන ආදායම තිරසාර සංවර්ධනය සඳහා හා ආර්ථික සංවර්ධනය සඳහා ඵලදායීව යෙදවීමට කටයුතු කර දීම තුළින් ඵලදායී සේවා නියුක්තිය සහතික කිරීම.				✓

අරමුණ - 17 තිරසාර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගතාවය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය	➢ වාර්ෂිකව එකතු කරනු ලබන මත්පැන් හා දුම්කොළ බදු ආදායම රාජ්‍ය භාණ්ඩාගාරයට නිශ්චිතව ලබාදීම හා සුරක්ෂිත කිරීම. ➢ නව තාක්ෂණය හඳුන්වා දීම හරහා ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා ERMS සහ RASED ක්‍රම හඳුන්වා දීම. ➢ ගෝලීයව ප්‍රචලිත ආරක්ෂක විධිවිධානයක් වන Fool Proof Sticker හෝ digital printing යොදා ගැනීම හරහා සුරාබදු ආදායම ආරක්ෂා කිරීම.				✓ ✓ ✓

පරිච්ඡේදය - 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක කළමනාකරණය

6.2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

6.3 පුරප්පාඩු පිළිබඳ තොරතුරු

6.4 මානව සම්පත් සංවර්ධනය


6.4.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකවන ආකාරය

6.4.2 මානව සම්පත් සංවර්ධනය - පුහුණු වැඩසටහන්


6.1 සේවක කළමනාකරණය

	2024.12.31 දිනට		
	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	70	18	52
තෘතීය	381	273	108
ද්විතීය	1,052	770	282
ප්‍රාථමික	146	81	65
එකතුව	**1,649**	**1,142**	**507**

6.2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය



- 2024 වර්ෂය තුළ පාලන අංශය මඟින් නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 08 ක් සඳහා ජ්‍යෙෂ්ඨත්වය අනුව සුරාබදු අධිකාරීවරුන් 06 දෙනෙකු සඳහා කාර්යයන් පැවරීම සිදු කර ඇත. සුරාබදු අධිකාරීවරුන් 11 දෙනෙකු සහකාර සුරාබදු කොමසාරිස් තනතුරෙහි රාජකාරී ඉටුකිරීම/ආවරණය/වැඩබැලීම කිරීම සිදු කරන ලදී. සුරාබදු අධිකාරී තනතුරු 31 සඳහා ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරුන් විසින් රාජකාරී ආවරණය කරන ලදී. සුරාබදු අධිකාරී තනතුරු 08ක් සහ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 13 ක් සඳහා නිලධාරීන් උසස්කිරීමට අයදුම්පත් කැඳවා ඇත
- තෘතීය මට්ටමේ උසස්වීම් ලෙස ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 13 ක් සඳහා නිලධාරීන් උසස් කිරීමට අයදුම්පත් කැඳවා ඇති අතර, ජ්‍යෙෂ්ඨත්වය සම්බන්ධයෙන් ඇති වූ ගැටළුවක් පිළිබඳව උපදෙස් ලබාගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. සීමිත පදනම මත සුරාබදු පරීක්ෂක තනතුරු 22 ක් සඳහාත්, විවෘත පදනම මත සුරාබදු පරීක්ෂක තනතුරු 34 ක් සඳහාත්, බඳවා ගැනීමට තරඟ විභාගය පවත්වා ඒවායේ ප්‍රතිඵල නිකුත් කර ඇත. සම්මුඛ පරීක්ෂණය ඉදිරියේදී පැවැත්වීමට නියමිතය.
- ද්විතීයික මට්ටමේ උසස්වීම් ලෙස සුරාබදු නියාමක තනතුරු 100 ක් විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා විභාගය පවත්වන ලද අතර සුදුසුකම් ලත් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණය ඉදිරියේදී පැවැත්වීමට නියමිතය.



- සුරාබදු නියාමක තනතුරු 11 ක් සඳහා සීමිත පදනමින් බඳවා ගැනීමට විභාගය හා සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති අතර ඉදිරියේදී අදාළ උසස්වීම් ලබා දීමට නියමිතය. සුරාබදු නියාමක රියදුරු තනතුරු 15 ක් සඳහා බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය පවත්වා එම ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය පවත්වා අවසන් කරන ලද අතර ඉන් අයදුම්කරුවන් 12 ක් සුදුසුකම් ලබන ලදී. ඒ අනුව ඉදිරියේ ඔවුනට පත්වීම් ලබාදීමට නියමිතය.

- දෙපාර්තමේන්තුවේ කාර්යභාරය මෑත කාලයේ වඩාත් පුළුල් වී තිබීමත්, රජයේ වියදම් සීමා කිරීම යටතේ නව බඳවා ගැනීම් සීමා කිරීම මත දෙපාර්තමේන්තුගත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 507ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස ගත්විට 31% කි. එබැවින් රාජකාරී සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීමෙන් දෙපාර්තමේන්තුවේ කාර්යයන් බොහෝමයක් පසුබෑමට ලක් වී ඇති අතර නිලධාරීන් වෙත ග්‍රහණ ඉලක්ක ලබාදීම ද මෙලෙස නිලධාරීන් සංඛ්‍යාව අඩුවීම නිසා අපහසු වන අතර මෙය දෙපාර්තමේන්තුවේ මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු කෙරෙහි සෘජුවම බලපානු ලබයි.

- එසේම දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක 886ක් ලබාදීමට කටයුතු කර ඇත. අග්‍රහාර රක්ෂණ ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්පත් 139 කට අදාළව ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කර ඇති අතර නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 33 දෙනෙකු සහ සිවිල් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකු විශ්‍රාම ගන්නා ලද අතර ඒ සම්බන්ධව කටයුතු සිදුකරන ලදී.

6.3 පුරප්පාඩු පිළිබඳ තොරතුරු - 2024 වර්ෂය

තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	2024.12.31 දිනට තත්ත්වය	පුරප්පාඩුව පැවති කාලය
අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම්)	1	මෙම තනතුර සඳහා පත්කිරීමට බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ කළ අයෙකු නොමැති වීම හේතුවෙන් පුරප්පාඩුව පවතී.	
අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පරිපාලන)	1	2024.09.27 දින සිට පුරප්පාඩුව පවතී.	මාස 03
සුරාබදු කොමසාරිස් (සමාජ ආරක්ෂණ හා සංවර්ධන)	1	2022.12.31 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 02
සුරාබදු කොමසාරිස් (ආදායම් හා මෙහෙයුම්)	1	2024.01.01 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	මාස 12
සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්)	1	2022.12.31 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 02
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන)	1	2021.10.28 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 03 මාස 02
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මානව සම්පත්)	1	2022.12.31 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 02
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (යෙදවුම්)	1	2022.12.31 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 02
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අධ්‍යයන හා පර්යේෂණ)	1	2023.12.28 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 01
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (සමාජ ආරක්ෂණ)	1	2021.07.20 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 03 මාස 05
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (සැපයුම් දාම නියාමන සහ තොරතුරු තාක්ෂණ)	1	2022.12.31 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 02

නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්)	1	2022.12.31 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 02
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (ආදායම්/ බලපත්‍ර)	1	2022.12.31 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 02
නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (නීති)	1	2022.12.31 දින සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී.	වසර 02
සහකාර සුරාබදු කොමසාරිස්	13	ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් විශ්‍රාම යාම හේතුවෙන් මෙම තනතුරු පුරප්පාඩු වී ඇත. සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු 07 ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.	
සුරාබදු අධිකාරී	21	ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් විශ්‍රාම යාම හේතුවෙන් මෙම තනතුරු පුරප්පාඩු වී ඇත. සුරාබදු අධිකාරී (සීමිත) තනතුරු 08ක් සඳහා උසස්වීම් ලබාදීමට අයදුම්පත් කැඳවා ඇත.	

6.4 මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අංශයේ මෙහෙවර ලෙස සුරාබදු දෙපාර්තමේන්තුව සතු මානව සම්පත දැනුම කුසලතා ආකල්ප වලින් සංවර්ධනය කරමින් ආයතනික මෙන්ම පුද්ගල අභිවෘද්ධිය සාක්ෂාත් කරගැනීමේ අදිටනින් නිවැරදිව සංවිධානය කිරීමේ අරමුණින් මානව සම්පත් අංශය මෙහෙයවීම සඳහා සුරාබදු කොමසාරිස්වරයෙකු හා නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයෙකුගේ සෘජු අධීක්ෂණය මත ක්‍රියාත්මක වේ. ඊට අමතරව අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් ආදායම් ප්‍රතිපත්ති හා පාලන යටතේ අධීක්ෂණය සිදුවේ. සුරාබදු දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පනාදරගම පිහිටා ඇති සුරාබදු විද්‍යාලය යොදා ගන්නා අතර ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය හා බාහිර ආයතන මගින් ද දායකත්වය ලබා ගනිමින් කටයුතු කරනු ලැබේ.

2024 වසර සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව සමස්ත නිල ඇඳුම් කාර්ය මණ්ඩලය මෙන්ම දීප ව්‍යාප්ත ඒකාබද්ධ සේවාවේ නිලධාරීන්ගේ කාර්ය මණ්ඩලය සඳහා අවමය පැය දොළහක පුහුණුවක් ලබාදීමට කටයුතු කර ඇත.

2024 වර්ෂය තුලදී සියලුම නිල ඇඳුම් කාර්ය මණ්ඩලයට නීතිය මෙන්ම දෙපාර්තමේන්තුවේ ලිපිලේඛන පිළිබඳව හා රාජ්‍ය පරිපාලන නීති සහ රෙගුලාසි පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා දෙන ලදී. මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට රාජ්‍ය මූල්‍යයන් පිළිබඳ ව විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තව ද සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවාවේ නිලධාරීන් සහ නිල ඇඳුම් කාර්ය මණ්ඩලය සඳහා බාහිර ආයතන මඟින් විශේෂ පුහුණු අවස්ථා ලබා දී ඇත. 18/2020 චක්‍රලේඛයට අනුව සෑම නිලධාරියෙකුටම දමිළ භාෂාව ඉගෙනීම තුළින් තම භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමට පුහුණු වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කරන ලදී. එපමණක් නොව නිෂ්පාදනාගාර, ස්කාගාර, ගුදම් රාජකාරී මෙන්ම දුම්කොළ හා මද්‍යසාර අධිකාරියේ නීති රෙගුලාසි සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

මානව සම්පත ශක්තිමත් කිරීම මෙන්ම සංවර්ධනය කරමින් සුරාබදු දෙපාර්තමේන්තු ඉලක්ක හා අරමුණු වලට ළඟාවීමට හැකි නිලධාරින් පිරිසක් බිහිකරමින් ඉන් ඔබ්බට ගොස් බාහිර සමාජයේ මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳව යෞවන යෞවනියන් හා පාසල් ළමුන් සහ විවිධ සංවිධාන සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය වැඩ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2024 වර්ෂය තුළ මානව සම්පත් අංශය විසින් පුහුණු වැඩසටහන් 16 ක් පවත්වා ඇති අතර රු.1,696,500.00ක මුදලක් වැය කරමින් සියලු කටයුතු කළමනාකරණය කරගෙන ඇත.

රට තුල උත්සන්න වූ ආර්ථික හා සමාජීය අර්බුදයේ බලපෑම මත ප්‍රතිපාදන දැඩි ලෙස සිමාවීම් වලට ලක්වීම නිසා සැලසුම් කල පුහුණු වැඩසටහන් බොහොමයක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතා ඇති වුවද සාර්ථක ඉලක්ක කරා ගමන් කිරීමට හැකිවිය.

2024 වර්ෂයේ පුහුණු වැඩසටහන් 16 ක් පවත්වා ඇති අතර ඒ සඳහා නිලධාරින් 1416 කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වූ අතර ඔවුන් සඳහා සහතිකපත්‍රයක් ද ලබාදීමට කටයුතු කරන ලදී. මෙම සියලු වැඩසටහන් සුරාබදු කොමසාරිස්වරයෙකු, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයෙකු හා ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරයෙකු ,සංවර්ධන නිලධාරියෙකු සහ කාර්යාල කාර්යය සහයෙකයෙකු මඟින් අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල්වරයෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ සිදුවීම සුවිශේෂී කරුණකි. මානව සම්පත් අංශය විසින් සිදුකරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තරයක් 6.4.2 මඟින් දැක්වේ.

6.4.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකවන ආකාරය

ආයතනය සතු වැදගත්ම සම්පත ලෙස මානව සම්පත හඳුනාගත හැකිය. එය ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට නිසි අයුරින් සකස් කිරීම මානව සම්පත් අංශය වෙත පැවරෙන කාර්යභාරයකි. පුද්ගල අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා පුහුණුව සහ සේවක සංවර්ධනය ඉතා වැදගත් වේ. සේවකයන්ගේ කාර්යක්ෂමතාව හා සඵලදායකත්වය ඉහළ නැංවීම සේවකයා තුළ ආත්ම විශ්වාසයක් ඇති කිරීම සේවක පුහුණුව තුළින් බලාපොරොත්තු වෙයි. මෙම ක්‍රියාවලිය තුළ දැනුම කුසලතා ආකල්ප යාවත්කාලීන කිරීම තුළින් සේවක කාර්ය සාධනය සේවක අභිප්‍රේරණය ඉහළ යාම තුලින් රැකියා තෘප්තිය වර්ධනය වීමටද ඉවහල් වෙයි.මේ තුළින් සුරාබදු දෙපාර්තමේන්තුවේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලය මෙන්ම ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සංවර්ධනයට ලක් කිරීම සඳහා මැදිහත්වීමක් සිදුකරනු ලබයි.

2024 වර්ෂයේ පුහුණු වැඩසටහන් 16 ක් පවත්වා ඇති අතර ඒ සඳහා නිලධාරීන් 1416 කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වූ අතර ඔවුන් සඳහා සහතිකපත්‍රයක් ද ලබාදීමට කටයුතු කරන ලදී.

මෙම කාර්යයට අමතරව සමාජ සත්කාරයක් ලෙස යොවුන් පරපුර, මත්ද්‍රව්‍ය හා නොයෙක් විෂමකාරී තත්ත්වයන්ගෙන් මුදවා ගැනීමට මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 10 කට ආසන්න ප්‍රමාණයක් පාසල්, යොවුන් මධ්‍යස්ථාන , මත්පැන් නිෂ්පාදන ආයතන සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තුළ මුදල් අයකිරීමකින් තොරව (නොමිලේ) ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් සිදු කිරීම සඳහා රජයේ ප්‍රතිපාදන වෙන් කර නොතිබුණත් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මෙම කටයුතු යම් දායකත්වයක් ලබාගෙන ඉටු කරන ලද පැසසිය යුතු සුවිශේෂ කටයුත්තකි. එමෙන්ම දෙපාර්තමේන්තුව තුළ සහ බාහිර අර්ධ රාජ්‍ය ආයතන තුළ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ද සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යෙදවීම මානව සම්පත් අංශය විසින් සිදු කිරීම අගය කල යුතුය.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අංශයේ මෙහෙවර ලෙස ඉහතින් සඳහන් කටයුතු ඉටුකිරීම තුළින් සුරාබදු දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් දැනුම, කුසලතා සහ ආකල්ප වලින් සංවර්ධනය කරමින් ආයතනික මෙන්ම පුද්ගල අභිවෘද්ධිය සාක්ෂාත් කරගැනීමේ අදිටනින් නිවැරදිව සංවිධානය කිරීමේ කාර්යය මෙහෙයවීම සඳහා කටයුතු කිරීමට මානව සම්පත් අංශයට හැකිවී ඇත.

6.4.2 මානව සම්පත් සංවර්ධනය - පුහුණු වැඩසටහන්

අනු අංකය	පාඨමාලාව	පැවැත්වූ ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව	වැය වූ මුදල	සහභාගි වූවන් සහ ලබා ගත් දැනුම
01	නිෂ්පාදනාගාර,ගුදම්, ස්කාගාර පුහුණුව	ප්‍රධාන කාර්යාලය	135	රු.130,000.00	සු.කො,සු.ප,සු.සැ.මේ,සු .සැ,සු.නි -නිෂ්පාදන ලේඛන පවත්වාගෙන යාම
02	තොරතුරු දැනගැනීමේ පනත සහ රාජ්‍ය නිලධාරීන්ගේ විනය ක්‍රියාපටිපාටි	ප්‍රධාන කාර්යාලය	286	රු.315,000.00	ස.සු.කො,සු.ප,සු.නි - විනය ක්‍රියාපටිපාටි සමාගම් නීතිය
03	අධිකරණ රාජකාරි සහ අධිකරණ ක්‍රියාපටිපාටි	පනාදරගම සුරාබදු පාසල	300	රු.325,000.00	සු.කො,සු.ප,සු.සැ.මේ,සු .සැ,සු.නි උසාවී ආකෘතියක් මඟින් ප්‍රයෝගික රාජකාරී අධ්‍යයනය
04	විගණනය / විගණන කටයුතු / විගණන විමසුම් හැඳින්වීම	ප්‍රධාන කාර්යාලය	100	රු.130,000.00	නි.සු.කො,ස.කො,ස්ථානාධිපති වාර්ෂික සැලසුම්,මූල්‍ය ලේඛන හා වාර්ෂික වාර්තා
05	දෙමළ භාෂා භාෂා ප්‍රවීනතා පුහුණු පාඨමාලාව පැය 150 (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව) (වැඩසටහන් 02)	මාර්ගගත	200	රු.344,000.00	සුරාබදු දෙපාර්තමේන්තුවේ සිවිල් කාර්යය මණ්ඩලයට හා දෙපාර්තමේන්තුගත නිලධාරීන්ට
06	පරිපාලන නීතිය	ප්‍රධාන කාර්යාලය	90	රු.90,000.00	සු.නි.කො,ස.සු.කො,සු. අධිකාරී සමාගම් ලියාපදිංචි කිරීමේ නීතිය
07	ගබඩා කළමනාකරණය සහ ඉන්වෙන්ටරි	නිපුනතා පියස	02	රු.20,000.00	කළමනාකරන සහකාර - ගබඩා කළමනාකරණය
08	වාහන නඩත්තු / රියදුරු ඵලදායී / ධාවන සටහන් සලකුණු කිරීම්	ඔරුගොඩවත්ත ජර්මන් කාර්මික විද්‍යාලය	80	රු.100,000.00	සු.රියදුරු-විනය හා කාර්යාලීය අචාර විධි

09	විනයකාර්ය පටිපාටි,මුදල් රෙගුලාසි හා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුව	ප්‍රධාන කාර්යාලය	105	රු.120,000.00	සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් මුදල් රෙගුලාසි,විනය පටිපාටි හා කාර්යාල ක්‍රම
10	පුහුණු වැඩසටහන (බාහිර දේශීය ආයතනය) i.සුරාබදු රසායනාගාර හා සම්බන්ධ පුහුණුව ii.උපදේශන පාඨමාලාව	Association Of Testing Laboratories 2.Smart Mind Counseling and Training	5 1	රු.87,500.00 රු.35,000.00	සුරාබදු පරීක්ෂක සුරාබදු රසායනාගාර හා සම්බන්ධ පුහුණුව සුරාබදු පරීක්ෂක උපදේශන
11	දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ නීති දැනුවත් කිරීම හා නිරාවරණය කිරීම සම්බන්ධ වැඩමුළුව	දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය	112	-	සු.ප හා ප්‍ර.සු.ප
		එකතුව		රු.1,696,500.00	

පරිච්ඡේදය - 07

අනුකූලතා වාර්තාව

7.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා දායකවන ආකාරය පිළිබඳ අනුකූලතා වාර්තාව

7.1 ආයතනයේ කාර්ය සාධනය උදෙසා දායකවන ආකාරය පිළිබඳ අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූල තත්ත්ව (අනුකූල වේ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ	1.ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මෙම ගිණුම අදාළ නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	2. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මෙම ගිණුම අදාළ නොවේ.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	3. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මෙම ගිණුම අදාළ නොවේ.	
1.6	වෙනත්	අදාළ නොවේ	4. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මෙම ගිණුම අදාළ නොවේ.	
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.5	සියලුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	භාණ්ඩ වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් (GAN20) ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික වාර්තාව සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
05	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමිත කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය කාර්යාල 106 ක් සහිතව ක්‍රියාත්මක වීම සහ නිලධාරී හිඟකම හේතුවෙන් පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම.	විගණන විමසුම් සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 404 (4) උප වගන්තිව ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණ**			
8.1	අංක 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදි ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	.	
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජන**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයේ උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හා වැඩ තහනම් කල නිලධාරීන්ගේ ණය ශේෂ පැවතීම.	ණය ශේෂ අයකර ගැනීමට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොත් ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලබාදීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසාව/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනත 08 හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් හෝ වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	2025 වර්ෂයේ සිට එවීමට කටයුතු කරමි.	

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලසුම් සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම සඳහාම වර්ෂයකට අවම වෂයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදී කොට තිබීම	අනුකූල වේ.		